# 2022.10.11 දින පැවති බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ හය වන සැසිවාරයේ පනස් පස් වන මහ සභා රැස්වීම් වාර්තාව

පැමිණීම

| | | | |
|---|---|---|---|
| 1. | එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා | - | ගරු සභාපති |
| 2. | සරත් ආර්.රණසිංහ මැතිතුමා | - | ගරු උප සභාපති |
| 3. | එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 4. | ඒ.එච්.ඉම්තියාස් මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 5. | මහේෂ් කොතලාවල මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 6. | සෝමසිරි දයාරත්න ගනේගොඩ මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 7. | බී.ඒ.අචිනි මදුභාෂි පීරිස් මැතිතුමිය | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි |
| 8. | රොෂාන් රාජිත පෙරේරා මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 9. | ඒ.ඒ .අජිත් කුමාර මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 10. | බී.ජී .දිලාන් රසික කුමාර මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 11. | කේ .මංජුල පෙරේරා මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 12. | ප්‍රියන්ත අල්විස් මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 13. | අජිත් කුමාර සෙනෙවිරත්න මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 14. | පියසේන වික්‍රමාරච්චි මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 15. | චතුරි සමන්ගා සුමිත්‍රාආරච්චි මැතිතුමිය | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි |
| 16. | ප්‍රනීත් වැලිවිටගේ මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 17. | එම්.නෆ්ලි මොහොමඩ් නසීර් මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 18. | ඩී.චම්පා ජයංගනී කන්නන්ගර මැතිතුමිය | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි |
| 19. | ඔසිල්මා මානෙල් කුමාරි මැතිතුමිය | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි |
| 20. | ආර්.එච්.ෂාමිලා සෙව්වන්දි මැතිතුමිය | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි |
| 21. | එච්.ඒ .ගාමිණී සරත්චන්ද්‍ර මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 22. | අකිල මිරංක පීරිස් මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 23. | බී.ජී .සුනේත්‍රා මැතිතුමිය | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි |
| 24. | බී.ඒ.දයානන්දනී පෙරේරා මැතිතුමිය | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි |
| 25. | ඒ.ජේ.එම්. සිම්සාර් මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 26. | චමින්ද දිසානායක මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 27. | ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 28. | මලින්ද කළුආරච්චි මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 29. | ජී.මාධව දිලංක පෙරේරා මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 30. | දීපානි කඳනආරච්චි මැතිණිය | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී |
| 31. | බී.ඩී.ඒ.කේ.ගයන්ති මිය | - | ලේකම් |

නොපැමිණීම

| | | | |
|---|---|---|---|
| 32. | කේ.එච් .දර්ශන ප්‍රියන්ත පීරිස් මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 33. | රුවන් පී .පෙරේරා මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 34. | කේ .සුරංජිත් සිල්වා මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |
| 35. | අයි .සුනිල් ප්‍රනාන්දු මැතිතුමා | - | ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී |

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ හය වන සැසිවාරයේ පනස් පස්වන මහ සභා රැස්වීම ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00ට තල්පිටිබද්ද ප්‍රාදේශීය සභා උප කාර්යාලයේ සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ කරන ලදි.



බ.ප්‍ර.ස.

## 01. 2022.09.13 දින පැවති මාසික මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම:

2022.09.13 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍ය වාර්තාවක් බව ගරු උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමන් විසින් යෝජනා කරන ලදි.

**සංශෝධන**

පිටු අංක 29
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රනීත් වැලිවිටගේ මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
මගේ අදහස් දැක්වීමේ **"දෙල්ගහවත්ත"** යන්න **"දෙල්ගස්වත්ත"** යනුවෙන්ද, **" ඒ වගේම විදාගම වැව පාරත්,හද්දාගොඩ සමරනායක පාරත් ඉක්මනින් කරලා දෙන්න කියලා ඉල්ලනවා."** යනුවෙන්ද **" අටුළුගම පාරේ අලුතින් ඉදිකළ අධි බලැති විදුලි රැහැන් පද්ධතිය හේතුවෙන්"** යනුවෙන්ද සංශෝධනය විය යුතුයි.

**ගරු උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමන් විසින් යෝජනා කර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් 2022.09.13 දින පැවති මාසික මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## 02. සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන :-

**2-1.** පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/10E /LAND_AQUI_K/2022 හා 2022.09.20 දිනැති "රජයේ ඉඩම් කැබලි සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගැනීම" මැයෙන් යුතු ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදි.

**2-2.** පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේදී සිදු කරන ලද පුස්තකාල ඇගයීම් තරගාවලියේ කළුතර දිස්ත්‍රික්කයේ III ශ්‍රේණියේ පුස්තකාල අතරින් බන්ඩාරගම ප්‍රාදේශීය සභාවට අයත් තල්පිටිබද්ද මහජන පුස්තකාලය පළමු ස්ථානය හිමි කර ගෙන ඇත. ඒ වගේම බස්නාහිර පළාතේ II ශ්‍රේණියේ පුස්තකාල අතරින් නව වන ස්ථානය බණ්ඩාරගම ඥාන ප්‍රදීප පුස්තකාලය ලබාගෙන ඇති බවට ගරු සභාපතිතුමන් විසින් සභාව දැනුවත් කරන ලදි.

## 03. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :-

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් පී.පෙරේරා මැතිතුමාගේත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සුනිල් ප්‍රනාන්දු මැතිතුමාගේත්, ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුරංජිත් සිල්වා මැතිතුමාගේත් අද දින මාසික මහ සභාව සඳහා නොපැමිණීම පිළිබද දැනුම් දීමේ යෝජනාවන් ගරු උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමා විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.දර්ශන පීරිස් මැතිතුමාගේ අද දින මාසික මහ සභාව සඳහා නොපැමිණීම පිළිබද දැනුම් දීමේ යෝජනාවන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.නෆ්ලි නසීර් මැතිතුමා විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරන ලදි.

ඉහත නොපැමිණීමේ යෝජනාවන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෝමසිරි දයාරත්න ගනේගොඩ මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ජී.සුනේත්‍රා මැතිණිය විසින් ස්ථිර කිරීමෙන් පසු මහ සභාව විසින් නොපැමිණි සභිකයින්ගේ නිවාඩු අනුමත කරන ලදි.

## 04. සංදේශ,පැමිණිලි හා පෙත්සම් ඉදිරිපත් කිරීම :- නැත

## 05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :- නැත

**06.** යථා පරිදි කල් දී ඇති යෝජනා :- ඇත

**06-01.**ගරු සභාපති එච්.ඒ.එච්. දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමාගේ යෝජනා :-

**06-01-I** 2018.04.10 වන දින මහ සභාවේ තීරණ අංක 5-5 අනුව 2022.09.01 සිට 2022.09.30 දින දක්වා මහ සභාවේ ආවරණ අනුමැතිය යටතේ කරන ලද (ඇමුණුම් අංක 01) ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ
ආවරණ අනුමැතිය යටතේ අංක 8හි මිරිස්මෝල අසල පාර සංවර්ධනය කිරීමට රු.25000/-ක් නේද සඳහන් කරලා තියෙන්නේ.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
අතුරුදවුම් මුදල තමයි දාලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ
ඒ වගේම අංක 9 හා 76 යටතේ බණ්ඩාරගම ආදාහනාගාරය වෙත ගෑස් ලබා ගැනීම සම්බන්ධව සඳහන් වෙනවා. මේ ගෑස් ලබා ගැනීම් සම්බන්ධව දින වකවානු සමඟ විධිමත් ක්‍රමවේදයකට අනුව සඳහන් කරනවා නම් හොඳයි. ඒ වගේම 95,96 යටතේ වාහන අළුත්වැඩියාවක් සම්බන්ධව ගෙවීම් දෙකක් සඳහන් වෙනවා.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
එක ගෙවීමක් වාහනය අළුත්වැඩියා කිරීම සම්බන්ධව අනෙක් ගෙවීම වාහනයේ සම්පූර්ණ සේවාවක් සිදු කළා. ඒ දෙක තමයි සඳහන් වෙන්නේ.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-II** 2018.04.10 වන දින මහ සභාවේ තීරණ අංක 5-11 අනුව 2022.09.08 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සකස් කිරීමේ කමිටුවේ අංක 7.1.1 සිට අංක 7.1.2 දක්වා වූ නිර්දේශයන් සඳහා (මුදල් හා ප්‍රතිපත්ති සකස් කිරීමේ කමිටු වාර්තාව ඇමුණුම් අංක 02 යටතේ දක්වා ඇත) අනුමැතිය ලබා දීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෝමසිරි දයාරත්න ගනේගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-III** 2022.09.08 දින පැවති ප්‍රසම්පාදන කමිටුවේ අංක 7.1.1 සිට අංක 7.1.27 දක්වා වූ නිර්දේශයන් සඳහා (ප්‍රසම්පාදන කමිටු වාර්තාව ඇමුණුම් අංක 04 යටතේ දක්වා ඇත) අනුමැතිය ලබා දීම සුදුසු බවටත්, එම නිර්දේශයන්ට අනුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවටත් මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-IV** ආයුර්වේද උඩු මහලෙහි කඩ කාමර අංක 02 සිට අංක 09 දක්වා (කඩ කාමර 08ක) බදු ගිවිසුම 2023.03.18 දිනෙන් අවසන් වේ. ඒ අනුව 2023.03.19 දින සිට 2028.03.18 දක්වා වසර 05ක කාලයකට දැනට සිටින බදු ගැනුම්කරුවන් සමඟ, කඩ කාමර කුළිය 2024.03.18 දින සිට ක්‍රියාත්මක වන නව තක්සේරුවට යටත්ව යන කොන්දේසිය මත ඇමුණුම් අංක 03හි ඇති කෙටුම්පත් ගිවිසුමට අනුව නැවත ගිවිසුම්ගත වීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත යෝජනාව ගරු උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

(ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉහත සඳහන් යෝජනාව සංශෝධනය කර සංශෝධිත යෝජනාවක් ඉදිරිපත් කරන ලදි.)

<u>සංශෝධිත යෝජනාව</u>

ආයුර්වේද උඩු මහලෙහි කඩ කාමර අංක 02 සිට අංක 09 දක්වා (කඩ කාමර 08ක) බදු ගිවිසුම 2023.03.18 දිනෙන් අවසන් වේ. දැනට පවතින මාසික කඩ කුළිය පදනම් වූ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ අංක KL/RP/3007 හා 2022.04.20 දිනැති තක්සේරු වාර්තාව.රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ අංක KL/RP/3007 හා 2022.10.06 දිනැති ලිපිය මගින් අවලංගු කර නව තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කර ඇති බැවින් (ඇමුණුම් A) එම තක්සේරු වාර්තාව පිළිගැනීමටත්,එම වාර්තාව අනුව 2023.03.19 දින සිට 2028.03.18 දින දක්වා වසර 05ක කාලයක් සඳහා දැනට සිටින බදුගැනුම්කරුවන් සමඟම කෙටුම්පත් ගිවිසුම අනුව (ඇමුණුම් B) නැවත ගිවිසුම්ගත වීමටත්, එහිදී නව තක්සේරුව ඉදිරි වසර 02ක් සඳහා බලපැවැත්වෙන බැවින් අදාළ ගිවිසුමේ ගිවිසුම් කොන්දේසි අංක 5 "ගිවිසගනු ලබන මාසික බදු කුලී මුදල සෑම වර්ෂ 02කට වරක් ප්‍රතිශෝධනය කරමින් ගිවිසුම්ගත කාලය සඳහා ක්‍රියාත්මක කළ යුතුය" ලෙස සංශෝධනය කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් සංශෝධිත යෝජනාව ගරු උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-V** නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 10හි බදු ගැනුම්කරු වන්නේ එම්.ඩබ්.ඒ.කරුණාරත්න මයා වන අතර එම කඩ කාමරය සම්බන්ධයෙන් වූ ගිවිසුම 2021.03.08 දිනෙන් අවසන් වූ බැවින් එදින සිට වසර 3කට අදාළව ගිවිසුම අළුත් කිරීමට කටයුතු සූදානම් කරන ලද අතර ඉහත කඩ කාමරය සඳහා බදු ගැනුම්කරු 2021.12.20 දින නීතිඥ උදය ජයවර්ධන මහතා ඉදිරියේදී ගිවිසුම් අත්සන් කරන ලද නමුත් මෙම කඩ කාමරයේ පවත්වාගෙන යන ව්‍යාපාරය පුපුරණ ද්‍රව්‍ය අලෙවිකිරීමේ කාර්යාලයක් පමණක් (පුපුරණ ද්‍රව්‍ය නොමැත) වන බැවින් ඒ සඳහා ව්‍යාපාර බදු ගෙවිය යුතු වුවද වෙළඳ බලපත්‍රයක් එම ව්‍යාපාරික ස්ථානයට නිකුත් කිරීම හේතුවෙන් සභාව වෙනුවෙන් ගිවිසුම අත්සන් නොකරන ලදි.
මේ සම්බන්ධව කරුනු විමසීමේදී ආදායම් පරීක්ෂක පී.ඒ.අමිල මහතා විසින් 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද වෙළඳ බලපත්‍ර සමීක්ෂණ වාර්තාවට අනුව වෙළඳ බලපත්‍රයක් ලබා දීමට නිර්දේශ කරන ලද බවත් ඒ අනුව බලපත්‍රයක් නිකුත් කර ඇති නමුත් මෙම ව්‍යාපාරය සඳහා ව්‍යාපාර බදු 2022 වර්ෂය සඳහා අය කර ගත යුතු බවත් දන්වා ඇත. තවද, 2022 වර්ෂය සඳහා ව්‍යාපාරයට අදාළව ව්‍යාපාර බදු ගෙවා ගිවිසුම් අත්සන් කිරිමට කටයුතු කරන ලෙස බදු ගැනුම්කරු වෙත ලිඛිතව දන්වා යවන ලද අතර එම කඩ කාමරයෙහි වහළය කැඩී ඇති බවටත් 2022 වර්ෂයේ ව්‍යාපාර කටයුතු සිදු නොකරන ලද බවටත් දන්වා ව්‍යාපාර බදු ගෙවීමට නොහැකි බව දන්වා ඇත.එකී කඩ කාමරයේ වහළය නිසි පරිදි සකස් කර ඇති අතර මෙම ව්‍යාපාරික ස්ථානය සඳහා 2021.03.09 දින සිට වලංගු වන පරිදි ගිවිසුම් අත්සන් කළ යුතු බැවින් මෙම ගැටළුව පිළිබඳ තීරණයක් ගැනීමටමුදල් හා ප්‍රතිපත්ති සකස් කිරීමේ කමිටුව වෙත ඉදිරිපත් කළ අතර එහිදී ගත් නිර්දේශ අනුව 2022

වර්ෂයට අදාළව ව්‍යාපාර බදු මුදල් හා 2022 පෙබරවාරි මාසයේ සිට හිඟ කඩ කුළී මුදල ගෙවා ගිවිසුම යාවත්කාලීන කිරීමට නිර්දේශ ලබා දී ඇත.
ඒ අනුව නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 10හි 2022 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු මුදල් හා 2022 පෙබරවාරි මාසයේ සිට හිඟ කඩ කුළී මුදල අයකර ගිවිසුම යාවත්කාලීන කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි. (2021.03.09 දින සිට 2022 ජනවාරි 31 දක්වා කඩ කුළී මුදල් ගෙවා ඇත.)

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-VI** බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව මගින් එකතු කරනු ලබන ඉදුල් කුණු ඉවත් කිරීම සඳහා ගිවිසුම් ගත වී ඇති කාලය 2022.12.31 දින දක්වා බල පැවැත්වෙන අතර ඊට අමතරව රැස්වන ඉදුල් කුණු (සත්ව ආහාර ලෙස ලබා දිය හැකි ද්‍රව්‍ය) 2022.09.08 දින ටෙන්ඩර් මණ්ඩලය විසින් උපරිම මිළ ගණන් යටතේ බැරල් 1ක් (ලීටර් 200) රු. 950.00 බැගින් ලබා දීමට නො. 28/49 කෙසෙල්වත්ත, පානදුර ලිපිනයේ පදිංචි මොහොමඩ් උවයිස් මොහොමඩ් රන්සාන් මහතාව තෝරාගෙන ඇත.
ඒ අනුව සභාව මගින් දෛනිකව රැස්කර ඔහු වෙත ලබා දෙන කසළ බදුන් සඳහා ඔහුගෙන් දෛනිකව මුදල් අයකිරීමේ පදනම මත හා රු.150,000/-ක ඇප ආරක්ෂණ මුදලක් සභාවේ තැන්පත් කිරීමේ කොන්දේසිය මත 2022.10.01 දින සිට 2023.09.30 දක්වා දක්වා වසරක කාලයකට ඇමුණුම් 05 ගිවිසුම් කෙටුම්පතට අනුව ගිවිසුම් ගත වීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෝමසිරි දයාරත්න ගනේගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-VII** ප්‍රාදේශීය මූල්‍ය රීති 203 අනුව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් සිදු කරන ලද සමීක්ෂණය අනුව සභාවට අයත් භාණ්ඩ,ලී බඩු, වාහන හා යන්ත්‍ර සූත්‍රවලට අදාල 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සභාගත කිරීමටත් එම වාර්තාවේ නිර්දේශ සලකා බලමින් වෙන්දේසි කළ යුතු භාණ්ඩ හා උපකරණ වෙන්දේසි කිරීමටත්, විනාශ කළ යුතු භාණ්ඩ හා උපකරණ විනාශ කිරීමටත්,අළුත්වැඩියා කල යුතු භාණ්ඩ හා උපකරණ අළුත්වැඩියා කිරීමටත් වට්ටෝරු ලේඛනයට ඇතුළත් කල යුතු භාණ්ඩ වට්ටෝරු ලේඛනයට ඇතුළත් කිරීමටත් සමීක්ෂණ මණ්ඩලය විසින් පෙන්වා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-VIII** බණ්ඩාරගම, වල්ගම ඩේවිඩ් පීරිස් ආයතනයට යන පාරේ වල්ගම පන්සල හන්දිය පහුකර ඩේවිඩ් පීරිස් ආයතනයට හැරී පළවෙනි ඉඩම අවසානයේ දකුණු පැත්තට පිංළිඳ ට යන කොන්ක්‍රීට් මාර්ගය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා මැනුම් කටයුතු කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෝමසිරි දයාරත්න ගනේගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-IX** බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් පද්ධතිය විශාල අභියෝගයකට මුහුණ දෙමින් පවතී. එනම් මේ දක්වා සේවයේ යෙදී සිටි පෙර පාසල් ගුරුවරුන් හතර දෙනාගෙන් එක් ගුරුවරයෙක් මාස 3කට පමණ පෙර විශ්‍රාම ගිය අතර තුවත් ගුරුවරයෙක් 2023 පෙබරවාරි මාසයේ විශ්‍රාම යාමට නියමිතව සිටී. මේ වන විටරජයේ ප්‍රතිපත්ති මත පුරප්පාඩු පිරවීමටද හැකියාව නොමැත. ස්වේච්ඡා පදනමින් සේවය ලබා දුන් සාමාජිකයින්ද රට තුළ පවත්නා ආර්ථික ගැටළුවලට දැඩි ලෙස මුහුණ දීමට සිදුව පවතින හෙයින් පෙර පාසල හැර යාමේ

ප්‍රවණතාවයක් පෙන්වයි. බස්නාහිර පළාත් පෙර පාසල් ප්‍රඥප්තියේ ප්‍රමිතීන්ට අනුව දරුවන් 20ක් සඳහා එක් ගුරුවරයෙකු සේවයේ යෙදවිය යුතුව ඇත. දැනට පෙර පාසල් පද්ධතිය තුළ සිසු දරුවන් 200ක් අධ්‍යාපනය ලබයි. ඒ අනුව පෙර පාසල් 4 ඉලක්ක කර ගනිමින් ගුරු සහයකයින් 4දෙනෙකු ව්‍යාපෘති පදනමින් 2023 ජනවාරි 01 දින සිට මාස 06ක කාලයක් සඳහා බඳවා ගැනීම සුදුසු බවටත්, දීමනා ලෙස සහා අරමුදලින් රු.978,028.78ක මුදලක් වැය කිරීම සුදුසු බවටත් මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

**යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

ගරු සභාපතිතුමනි, නාමළුව පෙර පාසලේ ඉන්නවා ස්වේච්ඡාවෙන් කටයුතු කරන ගරු මහත්මියක්. ඒ අයට මේක කරලා දෙන්න පුළුවන් නම් ලොකු දෙයක්.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

පෙර පාසල් හතරෙම ඉන්නවා වසර තුනකට වඩා ස්වේච්ඡාවෙන් සේවය කළ ගුරු මහත්මීන්. තවම ඒ අයට කිසිම දීමනාවක් ලබා දෙන්න බැරි වුනා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>

මේ යෝජනාව ගොඩක් හොඳයි. අපේ රටේ පූර්ව ළමා විය සංවර්ධනය සම්බන්ධව තියෙන ප්‍රතිපත්තියේ කොටසක් මේ යෝජනාව ඇතුලේ තියෙනවා. පූර්ව ළමා විය සංවර්ධනය කියන දේ අද වන විට අවධානමකට ලක් වෙලා තියෙනවා. අද වන විට ගුරුවරු ඇහිදිනවා. මේ තියෙන ආර්ථික තත්ත්වය ඇතුලේ කොහොමද පුද්ගලයෙක් අවුරුදු 3ක් ස්වේච්ඡාවෙන් සේවය කරන්නේ. නමුත් කුමන හෝ පදනමකින් ඒ අය වැඩ කරලා තියෙනවා. දැන් ඒ අය සේවය හැර යාමේ ප්‍රවනතාවයක් තියෙනවා කියලා මේ යෝජනාවෙන් කියවෙනවා. ව්‍යාපෘති පදනම මත නව ගුරුවරු බඳවා ගන්නවා මේ ගුරුවරුන්ගේ සුදුසුකම් පිළිබඳව නියාමනයක් තියෙනවාද? අපේ රටේ පූර්ව ළමා විය සංවර්ධනය පිළිබඳව මොනවද තියෙන ප්‍රතිපත්ති. මම සෑම මන්ත්‍රීවරයෙක්ගෙන්ම ඉල්ලනවා ඔබතුමන්ලා මේ සම්බන්ධව හොඳට හිතන්න.ළමයින්ට විධිමත් අධ්‍යාපනයක් මානසික සෞඛ්‍යක්, කායික සෞඛ්‍යක් නෑ. මෙහෙම ගිහිල්ලා අන්තිමට අපිට ඉතුරු වෙන්නේ කවුද? මේ රටේ පිල් බෙදිලා මේ කරන දේශපාලනය තුළ කවද්ද මේ රට අගාදයෙන් ගොඩ ගන්නේ කියන එක සම්බන්ධව නැවත නැවත හිතන්න කියලා සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලනවා.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

ප්‍රාදේශීය සභාව පැත්තෙන් අපිට කරන්න පුළුවන් උපරිමය කරනවා. මේ අවස්ථාවේ විශේෂයෙන් ස්තූති කරනවා ඒ ස්වේච්ඡා ගුරුවරු ඔවුන්ගේ කාලය බලන්නේ නැතුව පෙර පාසල් පද්ධතියට විශාල සේවාවක් කරනවා. සභාව පැත්තෙන් අපිට කරන්න පුළුවන් දේ දරු පරපුර වෙනුවෙන් කරනවා.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06-01-X** බණ්ඩාරගම දිස්ත්‍රික් රෝහලේ මානසික රෝගාබාද සඳහා ප්‍රතිකාර ලබන රෝගීන් හට කෙටි ආහාර වේල ලබාදීම සුව සරණ ව්‍යාපෘතිය 2022 ක්‍රියාත්මක කිරීමට අදාළ සභා තීරණය ලබාගෙන වැය අනුමැතියට යොමු කිරීමෙන් අනතුරුව රෝගීන් 40ක් සඳහා රු.3200.00 අත්තිකාරම් මුදලක් වැය වැය කිරීමට අනුමැතිය ලැබුණි. වර්තමානය වන විට ඒකකයක මිළ යෝජිත මිළට වඩා ඉහළ ගොස් ඇති බැවින් සතියකට ද්‍රව්‍ය මිලදී ගැනීමට රු. 5000.00ක අත්තිකාරම් මුදලක් වෙන් කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රනීත් වැලිවිටගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06-01-XI** බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා ඖෂධ මිලදී ගැනීම වෙනුවෙන් 1989 අංක 123 දරණ ප්‍රාදේශීය සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභාව පනතේ බලතල ප්‍රකාරව 2022 අයවැය මගින් 152-03-00-00-1210(1) වැය ශීර්ෂය

යටතේ වෙන් කර ඇති රු.2,500,000.00ක ප්‍රතිපාදිත මුදලින් රු.650,000.00ක මුදලක් වැය කිරීමට සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XII** බණ්ඩාරගම ඥාන ප්‍රදීප මහජන පුස්කාලය හා තල්පිටිබද්ද මහජන පුස්තකාලය මගින් 2022 වර්ෂයේ කියවීමේ මාසයට අදාළව පාසල් දරුවන් සඳහා නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබා දීමට අපේක්ෂා කරන බැවින්, 2022.10.16 දින සිට 2022.10.29 දින දක්වා සතියක කාලයක් නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබා දීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රනීත් වැලිවිටගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XIII** බණ්ඩාරගම ඥාන ප්‍රදීප මහජන පුස්කාලය හා තල්පිටිබද්ද මහජන පුස්තකාලය මගින් 2022 වර්ෂයේ කියවීමේ මාසයට අදාළව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

1) ප්‍රදේශයේ කාන්තාවන් සඳහා ස්වයං රැකියාවක් ලෙස සිදුකිරීමට සාරි ජැකට් මැසීමේ එක්දින පාඨමාලාවක් පැවැත්වීම.
2) කාන්තා සෞඛ්‍යය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
3) ගෘහස්ත පුස්තකාල තරඟ පැවැත්වීම.
4) ගෙවතු වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීම.
5) පුස්තකාල පිටත පරිශ්‍රයේ ඇති බංකු ආශ්‍රිතව සඟරා හා පුවත්පත් කියවීමේ පහසුකම් සැලසීම.
6) කියවීමේ මාසයේ තේමාවට අදාලව රචනා, චිත්‍ර හා ප්‍රහේලිකා තරඟ පැවැත්වීම.
7) කියවීමේ මාසයට සමගාමීව සඟරාවක් එළිදැක්වීම.
8) පෝස්ටර් තරඟ පැවැත්වීම.
9) පාසල් දරුවන් සඳහා නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබාදීම.
10) හොඳම පාඨකයා තේරීම.
11) නව ජංගම සේවාවක් ආරම්භ කිරීම.
12) කතන්දර පැය, අත්කම් පැය, චිත්‍ර පැය, ළමා නාට්‍ය, ළමා චිත්‍රපට Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීම.
13) පුස්තකාලය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
14) ඔරිගාමි අත්කම් නිර්මාණ පුහුණු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
15) පොත් සළකුණුපත් නිර්මාණය කිරීම හා නොමිලේ ලබාදීම.
16) පුස්තකාල පාඨකයින් සඳහා ආසියානු පදනම හා සම්බන්ධව Let's Read Application භාවිතය පිළිබඳව වැඩසටහනක් පැවැත්වීම.
17) පාඨකයන්හට තමන්ගේ පොත් සංරක්ෂණය කර ගැනීම සඳහා සරල ලෙස පොතක් බැඳීම සිදුකරන ආකාරය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
18) පාසල් දරුවන් සඳහා චිත්‍ර පන්තියක් පැවැත්වීම.
19) අ.පො.ස. සා.පෙළ හා උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන් සඳහා උපදේශන වැඩසටහනක් පැවැත්වීම.
20) අ.පො.ස. සා.පෙළ සිසුන් සඳහා විෂය සමගාමී සම්මන්ත්‍රණ සතියක් පැවැත්වීම.
21) ළමා කියවීම් ප්‍රවර්ධනය සඳහා කියවීමේ කඳවුරු පැවැත්වීම.
22) අන්තර්ජාල පහසුකම් සැලසීම හා ප්‍රජා තොරතුරු ඒකකය වැඩිදියුණු කිරීම.
23) පුස්තකාලයට නව ප්‍රවේශ පොත් ලබාගැනීමේදී පාසල්වලින් අවශ්‍ය පොත් පිළිබඳ තොරතුරු ලබා ගැනීම හා දැන්වීම් පළකිරීම මගින් තොරතුරු ලබා ගැනීම.
24) පාඨක සමාජය ප්‍රතිසංවිධානය කිරීම.
25) ප්ලාස්ටික් ප්‍රතිචක්රීකරණය කිරීම සඳහා එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පුස්තකාල පරිශ්‍රය ආශ්‍රිතව පවත්වාගෙන යාම.
26) බිත්ති පුවත්පත් මගින් පාඨක නිර්මාණ එළිදැක්වීම.
27) ශාඛා පුස්තකාල හා ඒකාබද්ධව කියවීමේ මාසයේ තේමාවට අදාලව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
28) පුස්තකාල මගින් සිදුකරන ලද වැඩසටහන් පිළිබඳ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම.
29) පුස්තකාලයේ ඇති පොත් පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීම.
30) ප්‍රාදේශීය වශයෙන් කලාකරු ඇගයීම සිදු කිරීම.(සාහිත්‍ය උත්සවයට සමගාමීව)

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XIV** බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව සතුව පවතින තැටි නඟුල හා කොකු නඟුල (ට්‍රැක්ටරය සමඟ) බල ප්‍රදේශයේ හා බල ප්‍රදේශයෙන් පිටත සේවා අවශ්‍යතා වෙනුවෙන් ලබා දීම වෙනුවෙන් පහත සඳහන් පරිදි සේවා ගාස්තුවක් අය කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

බල ප්‍රදේශය තුළ (ට්‍රැක්ටරය සමඟ) රු.4000.00 } වැඩ අංගනයේ සිට ආරම්භක ධාවන පැය මාපාංකය 1 සිට ගාස්තු අය කිරීම සිදු කරයි.
බල ප්‍රදේශයෙන් පිටත (ට්‍රැක්ටරය සමඟ)රු.5000.00

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XV** බණ්ඩාරගම මෛත්‍රී නගර ශාලාවේ අඩු පාඩුව පවතින පහත සඳහන් උපකරණ මිළදී ගැනීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- Soumd Mixer (16 channel)
- Wireless Microphone (FM) (JBL)
- Microphone – 10
- Mixing and distribution amps
- Crossover
- Sound effects
- XLR male Female socket and winr
- Standared socket

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XVI** බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට අයත් රේරුකාන ප්‍රජා ශාලා භූමියේ පිහිටි එක්සත් අවමංගල්‍යාදාර සුභ සාධක සමිතිය පවත්වන ගොඩනැගිල්ල සඳහා විදුලි බලය ලබා ගැනීම සුදුසු බවටත්, (මාසික විදුලි බිල්පත එක්සත් අවමංගල්‍යාධාර සමිතිය මගින් ගෙවීමට යටත්ව) විදුලිය ලබා ගැනීම සඳහා වැය වන රු. 28,500.00ක මුදලක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවටත් මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රනීත් වැලිවිටගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XVII** නාගරික සංවර්ධන අධිකාරියේ DDG/P2/PC/LA හා 2022.05.26 හා 05/05/10/03/02/04/Gen-2019 හා 2022.08.22 දිනැති ලිපි පරිදි 2022 ජුනි මස සිට සැළසුම් කමිටු දීමනාව එක් සාමාජිකයකු වෙනුවෙන් රු.2500.00ක් ලෙස සංශෝධනය කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෝමසිරි දයාරත්න ගනේගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XVIII** දැනට රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ජාතික අය වැය චක්‍රලේඛ අංක 03/2022 හි දක්වා ඇති පරිදි සන්නිවේදන කටයුතු සඳහා හැකිතාක් විද්‍යුත් ක්‍රමවේද භාවිතායට හා මුද්‍රණ කටයුතු සඳහා වන පිරිවැය අවම කිරීමට අදාළ වූ තොරතුරු ඇතුළත් ලිපි යනාදිය දෘඪ පිටපත් යොමු කිරීමක් සඳහා අවධානය යොමු කර ඇත. ප්‍රාදේශීය සභාවේ සාමාන්‍ය රැස්වීමක් කැඳවීම සඳහා වූ දැන්වීම සමඟ න්‍යාය පත්‍රය භෞතිකව භාර දීම මේ දක්වා සිදු කර ඇත. දැනට උද්ගතව පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් කඩදාසි යනාදිය භාවිතා කිරීම අවම කිරීම සුදුසු වන අතර ප්‍රාදේශීය සභා රැස්වීම් කටයුතු පිළිබඳ රීති අනුව සභාව කැඳවීම හා ඊට අදාළ ලේඛන භාරදීම විද්‍යුත් තැපෑලෙන් සිදු කළ යුතු බවට සභාවට තීරණය කළ හැකිය. ඒ අනුව රැස්වීම් කැඳවීම සඳහා වූ දැන්වීම හා ඊට අදාළ සියලු ලේඛන සියළුම සභිකයින්ගේ විද්‍යුත් ලිපිනයට (සභාවේ සියලුම සභිකයින් තමන්ගේ විද්‍යුත් ලිපිනය බවට සනාථ කරන ලද විද්‍යුත් ලිපිනයක් ලේකම් වෙත භාර දිය යුතුය) නියමිත කාලය ඉතිරි කර යොමු කර තිබීම නිත්‍යානුකූල භාරදීමක් ලෙස සැලකෙන බැවින් සභාවේ සාමාන්‍ය රැස්වීමක් කැඳවීම සනාථවූ දැන්වීම හා න්‍යාය පත්‍රය ඇතුළත් ලේඛන විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

**යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් සෙනෙවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>

මේ යෝජනාව සම්බන්ධව ගැටළුවක් නෑ. නවීන තාක්ෂණයත් සමඟ අපි එතනට යන්න ඕනා. මේකෙ විද්්‍යුත් තැපැල කියලා සඳහන් කරලා තියෙන්නේ. අපි නිරන්තරයෙන් විද්‍යුත් තැපැල භාවිතා කරනවා.නමුත් ඒකට අවශ්‍ය උපාංග නැති සහ ඒකට අපහසුතා තියෙන මන්ත්‍රීවරුන් මෙතන ඉන්නවා. ඒ අයගේත් අයිතිය මෙතනදී ආරක්ෂා වෙන්න ඕනා. ඒ නිසා මේකට නිශ්චිත ක්‍රමවේදයක් හදන්න ඕනා. බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් WhatsApp Group එකක් හදලා ඒ හරහා දැනුම්දීමක් කරන්න.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

අපි ආරම්භයක් විදිහට කරපු. පහසුකම් තියෙන මන්ත්‍රීවරුන්ට අවශ්‍ය පණිවිඩ ටික දෙමු. අනිත් අයට පවතින ක්‍රමයෙන්ම ලබා දෙමු. ඒ අයත් භාවිතයත් එක්ක කාලයත් සමඟ හුරු වෙයි.අපි ආරම්භයක් විදිහට පහසුකම් තියෙන අයට යවමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>

විද්‍යුත් තැපෑලෙන් යවන කොට ගොඩක් අයට අපහසු වෙයි. අපිට WhatsApp මගින් PDF එකක් විදිහට එවන්න. සභාවේ යෝජනාවක් සම්මත කරගෙන WhatsApp මගින් PDF කරලා තොරතුරු ටික ලබා දෙන්න.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

රීතිවල තියෙන්නේ විද්‍යුත් ලිපිනයට කියලා. ඔබතුමා කියන සංශෝධනයන්ට යටත්ව මේ යෝජනාව ක්‍රියාත්මක කරමු.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් සෙනෙවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර සභිකයින් වෙත තොරතුරු ලබා දිය හැකි පහසු සන්නිවේදන මාධයක් භාවිතා කිරීමට එකඟව යෝජනාව බෙදීමක් නොමැතිව ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XIX** ව්‍යාපෘති පදනම මත බඳවා ගත් සේවකයින් යොදා මාර්ග ප්‍රිමික්ස් කරලීම ව්‍යාපෘතියේ 2022.09.01 දින සිට 2022.09.30 දින දක්වා පහත සඳහන් වැඩ වාර්තාව පිළිගැනීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඉහත නම් සඳහන් සේවකයින් කරන ලද සේවාවන් පහතින් දැක්වේ.

| අනු අංකය | දිනය | යෙදවූ සේවකයින් | කාර්යය / විස්තරය |
|---|---|---|---|
| 1 | 2022.09.01 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | එම්.ඒ.එච්. හේමන්ත | බණ්ඩාරගම පෙර පාසලේ තණකොල කැපීම. |
| | | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 2 | 2022.09.02 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එම්.ඒ.එච්. හේමන්ත / බී.ඒ.ඒ.එම්. පීරිස් | අරුග්ගොඩ පොදු පහසුකම් ඉඩමේ ගසක් කැපීම. |
| | | ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ / කේ. වසන්ත පෙරේරා | කඹුරුගොඩ තණකොල කැපීම. |
| | | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 3 | 2022.09.03 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 4 | 2022.09.04 | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 5 | 2022.09.05 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එම්.ඒ.එච්. හේමන්ත / ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ | වැඩ අංගනයේ පවිත්‍ර කටයුතු කිරීම. |
| | | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 6 | 2022.09.06 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | කේ. වසන්ත පෙරේරා / ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ | වැසිකිලි ආධාර බෙදීම. |
| | | එම්.ඒ.එච්. හේමන්ත / බී.ඒ.ඒ.එම්. පීරිස් | කායවර්ධන මධ්‍යස්ථානයේ වගා කටයුතු කිරීම. |
| | | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 7 | 2022.09.07 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ / එම්.ඒ.එච්. හේමන්ත / බී.ඒ.ඒ.එම්. පීරිස් / කේ. වසන්ත පෙරේරා | බණ්ඩාරගම නගරයේ ශ්‍රමදාන කටයුත්තට සහභාගී වීම. |
| | | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 8 | 2022.09.08 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | කේ. වසන්ත පෙරේරා / ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ | පෙරමුසු දැමීම. |
| | | එම්.ඒ.එච්. හේමන්ත / බී.ඒ.ඒ.එම්. පීරිස් | ගම්මන්පිල වල්ගම පාර තණකොල කැපීම. |
| | | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 9 | 2022.09.09 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | කේ. වසන්ත පෙරේරා / බී.ඒ.ඒ.එම්. පීරිස් / ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ | පැල සිටුවීමට වළවල් සැකසීම, රයිගම අනවසර වැටක් ඉවත් කිරීම, උඳුගොඩ පාර වතුර කාණුවක් පවිත්‍ර කිරීම. |
| | | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 10 | 2022.09.10 | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 11 | 2022.09.11 | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 12 | 2022.09.12 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | කේ. වසන්ත පෙරේරා / එම්.ඒ.එච්. හේමන්ත / බී.ඒ.ඒ.එම්. පීරිස් | ගම්මන්පිල සුහසිංහ මාවත දෙපස තණකොළ කැපීම. |
| | | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 13 | 2022.09.13 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | කේ. වසන්ත පෙරේරා / ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ/ | බණ්ඩාරගම නගර මධ්‍යයේ ඇති සියඹලා ගස ඉවත් කිරීම. |
| | | එම්.ඒ.එච්. හේමන්ත / බී.ඒ.ඒ.එම්. පීරිස් | සමරනායක මාවත තණකොල කැපීම. |
| | | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 14 | 2022.09.14 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එම්.ඒ.එච්. හේමන්ත | පෙරමුසු දැමීම. |
| | | කේ. වසන්ත පෙරේරා / බී.ඒ.ඒ.එම්. පීරිස් /ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ | සමරනායක මාවත තණකොල කැපීම. |

| | | | |
|---|---|---|---|
| | | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 15 | 2022.09.15 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එම්.ඒ.එච්. හේමන්ත / ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ / බී.ඒ.ඒ.එම්. පීරිස් | කොඩි කණු ගැසීම, කාර්යාලයේ තණකොල කැපීම. |
| | | එම්.ඩී.සමීර / පී.වී.ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 16 | 2022.09.16 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එම්.ඒ.එච්. හේමන්ත / බී.ඒ.ඒ.එම්. පීරිස් | පෙරමුසු දැමීම. |
| | | ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ | මඩු පුටු ගැසීමට යාම. |
| | | එම්.ඩී. සමීර | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 17 | 2022.09.17 | එම්.ඩී. සමීර / පී.වී. ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 18 | 2022.09.18 | එම්.ඩී. සමීර / පී.වී. ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 19 | 2022.09.19 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එම්.ඩී. සමීර / පී.වී. ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 20 | 2022.09.20 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ | පාලම් පාරුවේ සේවය කිරීම. |
| | | කේ. වසන්ත පෙරේරා / එම්.ඒ.එච්. හේමන්ත | සමරනායක මාවත තණකොල කැපීම. |
| 21 | 2022.09.21 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | කේ. වසන්ත පෙරේරා / එම්.ඒ.එච්. හේමන්ත / බී.ඒ.ඒ.එම්. පීරිස් | බණ්ඩාරගම ජාතික පාසල පිටුපස පාර තණකොල කපා පවිත්‍ර කිරීම. |
| | | ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ | පාලම් පාරුවේ සේවය කිරීම. |
| | | පී.වී. ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 22 | 2022.09.22 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එම්.ඒ.එච්. හේමන්ත / බී.ඒ.ඒ.එම්. පීරිස් | බණ්ඩාරගම පාසල පිටුපස පාර තණකොල කැපීම. |
| | | ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ | පෙරමුසු දැමීම. |
| | | පී.වී. ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 23 | 2022.09.23 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම |
| | | එම්.ඒ.එච්. හේමන්ත | කඹුරුගොඩ අඹ ඉඩම තණකොල කැපීම. |
| | | එම්.ඩී. සමීර / පී.වී. ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 24 | 2022.09.24 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| 25 | 2022.09.26 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| 26 | 2022.09.27 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම |
| | | ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ | වීදාගම මෝල පාර තණකොල කැපීම. |
| | | එම්.ඩී. සමීර / පී.වී. ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 27 | 2022.09.28 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එම්.ඒ.එච්. හේමන්ත / ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ/ බී.ඒ.ඒ.එම්. පීරිස් | බණ්ඩාරගම පාසල පාරේ තණකොල කැපීම. |
| | | එම්.ඩී. සමීර / පී.වී. ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 28 | 2022.09.29 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එම්.ඒ.එච්. හේමන්ත / බී.ඒ.ඒ.එම්. පීරිස් | පෙරමුසු දැමීම. |
| | | ඒ.ඒ. කුෂාන් කුමාර අමරසිංහ | කලායතන පාර තණකොල කැපීම. |
| | | එම්.ඩී. සමීර / පී.වී. ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |
| 29 | 2022.09.30 | කේ. කීර්ති කුමාර | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එම්.ඒ.එච්. හේමන්ත | ආදාහනාගාර පාර තණකොල කැපීම. |
| | | එම්.ඩී. සමීර / පී.වී. ජනක | පාලම් පාරුවේ සේවය කිරීම. |

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XX** ව්‍යාපෘති පදනම මත බඳවා ගත් සේවකයින් යොදා ඩෙංගු මර්දන ව්‍යාපෘතියේ 2022.09.01 දින සිට 2022.09.30 දින දක්වා පහත සඳහන් වැඩ වාර්තාව පිළිගැනීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඉහත නම් සඳහන් සේවකයින් කරන ලද සේවාවන් පහතින් දැක්වේ.

| අනු අංකය | දිනය | යෙදවූ සේවකයින් | කාර්යය / විස්තරය |
|---|---|---|---|
| 1 | 2022.09.01 | එස්. දිලීප රොෂාන් ජයදේව / කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | නගරය පිරිසිදු කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | කේ. ජයසංඛ මධුශාන් පීරිස් | JCB සහායක ලෙස කටයුතු කිරීම. |
| | | ජී. අනුර කුමාර | PA - 0173 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | බණ්ඩාරගම මෛත්‍රී පෙර පාසල ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 2 | 2022.09.02 | එස්. දිලීප රොෂාන් ජයදේව | නගරය පිරිසිදු කිරීම |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | කේ. ජයසංඛ මධුශාන් පීරිස් | JCB සහායක ලෙස කටයුතු කිරීම. |
| | | ජී. අනුර කුමාර | PA - 0173 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| 3 | 2022.09.03 | එස්. දිලීප රොෂාන් ජයදේව | නගරය පිරිසිදු කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ජී. අනුර කුමාර | PA - 0173 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| 4 | 2022.09.04 | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | තල්පිටිබද්ද මහජන පුස්තකාලයේ ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 5 | 2022.09.05 | එස්. දිලීප රොෂාන් ජයදේව / කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | නගරය පිරිසිදු කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ජී. අනුර කුමාර | PA - 0173 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| 6 | 2022.09.06 | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | කේ. ජයසංඛ මධුශාන් පීරිස් | JCB සහායක ලෙස කටයුතු කිරීම. |
| | | ජී. අනුර කුමාර | QH - 2253 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| 7 | 2022.09.07 | එස්. දිලීප රොෂාන් ජයදේව / කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | නගරය පිරිසිදු කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | කේ. ජයසංඛ මධුශාන් පීරිස් | JCB සහායක ලෙස කටයුතු කිරීම. |
| | | ජී. අනුර කුමාර | ප්‍රධාන කාර්යාලයේ කටයුතු සඳහා සහාය වීම. |
| 8 | 2022.09.08 | එස්. දිලීප රොෂාන් ජයදේව / කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | නගරය පිරිසිදු කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ජී. අනුර කුමාර | PT – 8494 රථයේ (විදුලි අංශය) රියදුරු ලෙස සේවය කිරීම. |
| 9 | 2022.09.09 | එස්. දිලීප රොෂාන් ජයදේව / කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | නගරය පිරිසිදු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | එම්. ජගත් දේශප්‍රිය | සම්පත් කේන්ද්‍රයේ සේවය කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ජී. අනුර කුමාර | QH - 2253 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| 10 | 2022.09.10 | එස්. දිලීප රොෂාන් ජයදේව / කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | නගරය පිරිසිදු කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ජී. අනුර කුමාර | LL - 7677 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| 11 | 2022.09.11 | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ජී. අනුර කුමාර | LL - 7677 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| 12 | 2022.09.12 | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | කේ. ජයසංඛ මධුශාන් පීරිස් | JCB සහායක ලෙස කටයුතු කිරීම. |
| | | ජී. අනුර කුමාර | LL - 7677 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | බණ්ඩාරගම මහජන පුස්තකාලයේ ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 13 | 2022.09.13 | එස්. දිලීප රොෂාන් ජයදේව | නගරය පිරිසිදු කිරීම. |
| | | කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එම්. ජගත් දේශප්‍රිය | සම්පත් කේන්ද්‍රයේ සේවය කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | කේ. ජයසංඛ මධුශාන් පීරිස් | JCB සහායක ලෙස කටයුතු කිරීම. |
| | | ජී. අනුර කුමාර | PA - 0173 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | නාමළුව මෛත්‍රී පෙර පාසල ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 14 | 2022.09.14 | එස්. දිලීප රොෂාන් ජයදේව / කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | නගරය පිරිසිදු කිරීම. |
| | | එම්. ජගත් දේශප්‍රිය | සම්පත් කේන්ද්‍රයේ සේවය කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | චන්දන ප්‍රියවිකුම් | කායවර්ධන මධ්‍යස්ථානයේ තණකොල උදළු ගෑම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | අටුළුගම මෛත්‍රී පෙර පාසල ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 15 | 2022.09.15 | එස්. දිලීප රොෂාන් ජයදේව / කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | නගරය පිරිසිදු කිරීම. |
| | | එම්. ජගත් දේශප්‍රිය | සම්පත් කේන්ද්‍රයේ සේවය කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ජී. අනුර කුමාර | LL - 7677 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | බණ්ඩාරගම මෛත්‍රී පෙර පාසල ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 16 | 2022.09.16 | එස්. දිලීප රොෂාන් ජයදේව / කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | නගරය පිරිසිදු කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ජී. අනුර කුමාර | LL - 7677 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | තල්පිටිබද්ද මහජන පුස්තකාලයේ ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 17 | 2022.09.17 | එස්. දිලීප රොෂාන් ජයදේව | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එම්. ජගත් දේශප්‍රිය | සම්පත් කේන්ද්‍රයේ සේවය කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ජී. අනුර කුමාර | PA - 0173 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | නාමළුව මෛත්‍රී පෙර පාසල ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 18 | 2022.09.18 | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | ජී. අනුර කුමාර | PA - 0173 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| 19 | 2022.09.19 | එස්. දිලීප රොෂාන් ජයදේව / කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | නගරය පිරිසිදු කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ජී. අනුර කුමාර | LL - 7677 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| 20 | 2022.09.20 | එස්. දිලීප රොෂාන් ජයදේව / කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | නගරය පිරිසිදු කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ජී. අනුර කුමාර | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | අටුළුගම මෛත්‍රී පෙර පාසල ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 21 | 2022.09.21 | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ඒ. චන්දන ප්‍රියවිකුම් / පී.ඩී. රුවන්ත සංජීව | සමරනායක මාවත කාණුව පවිත්‍ර කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | බණ්ඩාරගම මහජන පුස්තකාලයේ ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 22 | 2022.09.22 | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | එස්. දිලීප රොෂාන් ජයදේව | නගරය පිරිසිදු කිරීම. |
| | | කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | සම්පත් කේන්ද්‍රයේ සේවය කිරීම. |
| | | ඒ. චන්දන ප්‍රියවිකුම් / පී.ඩී. රුවන්ත සංජීව | සමරනායක මාවත තණකොල කැපීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ජී. අනුර කුමාර | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | නාමළුව මෛත්‍රී පෙර පාසල ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 23 | 2022.09.23 | එස්. දිලීප රොෂාන් ජයදේව | නගරය පිරිසිදු කිරීම. |
| | | කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | සම්පත් කේන්ද්‍රයේ සේවය කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ඒ. චන්දන ප්‍රියවිකුම් / පී.ඩී. රුවන්ත සංජීව | කඹුරුගොඩ අඹ ඉඩම තණකොල කැපීම. |
| | | ජී. අනුර කුමාර | LL - 7677 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | අටුළුගම මෛත්‍රී පෙර පාසල ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 24 | 2022.09.24 | එස්. දිලීප රොෂාන් ජයදේව / කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | අයි. කපිල කුමාර පෙරේරා | කසල ට්‍රැක්ටර් රථයක සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | කේ. ජයසංඛ මධුශාන් පීරිස් | JCB සහායක ලෙස කටයුතු කිරීම. |
| | | ජී. අනුර කුමාර | PA - 0173 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | නාමළුව මෛත්‍රී පෙර පාසල ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 25 | 2022.09.25 | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| 26 | 2022.09.26 | එස්. දිලීප රොෂාන් ජයදේව | නගරය පිරිසිදු කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | ඒ. චන්දන ප්‍රියවිකුම් | පෙරමුසු දැමීම. |
| | | පී.ඩී. රුවන්ත සංජීව | ජාතික පාසල පාර තණකොල කැපීම. |
| | | කේ. ජයසංඛ මධුශාන් පීරිස් | JCB සහායක ලෙස කටයුතු කිරීම. |
| | | ජී. අනුර කුමාර | ප්‍රධාන කාර්යාලයේ කටයුතු සඳහා සහාය වීම. |
| 27 | 2022.09.27 | පී.ඩී. රුවන්ත සංජීව / ඒ. චන්දන ප්‍රියවිකුම් | ජාතික පාසල අසල පාර කාණු පවිත්‍ර කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | කේ. ජයසංඛ මධුශාන් පීරිස් | JCB සහායක ලෙස කටයුතු කිරීම. |
| | | ජී. අනුර කුමාර | PT - 8494 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | තල්පිටිබද්ද මහජන පුස්තකාලයේ ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 28 | 2022.09.28 | එස්. දිලීප රොෂාන් ජයදේව | නගරය පිරිසිදු කිරීම. |
| | | කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | සම්පත් කේන්ද්‍රයේ සේවය කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | කේ. ජයසංඛ මධුශාන් පීරිස් | JCB සහායක ලෙස කටයුතු කිරීම. |
| | | ජී. අනුර කුමාර | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | බණ්ඩාරගම මහජන පුස්තකාලයේ ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 29 | 2022.09.29 | එස්. දිලීප රොෂාන් ජයදේව | නගරය පිරිසිදු කිරීම. |
| | | කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | සම්පත් කේන්ද්‍රයේ සේවය කිරීම. |
| | | සමීර මධුසංඛ පොන්නම්පෙරුම | බණ්ඩාරගම වැඩ අංගනයේ සේවය කිරීම. |
| | | කේ. ජයසංඛ මධුශාන් පීරිස් | JCB සහායක ලෙස කටයුතු කිරීම, කලායතන පාර තණකොල කැපීම. |
| | | ජී. අනුර කුමාර | QH - 2253 රථයේ රියදුරු හා ප්‍රධාන කාර්යාලයේ සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | බණ්ඩාරගම මෛත්‍රී පෙර පාසල ඩෙංගු පරීක්ෂා කිරීම. |
| 30 | 2022.09.30 | එස්. දිලීප රොෂාන් ජයදේව | නගරය පිරිසිදු කිරීම. |
| | | කේ.කේ. ලසන්ත ප්‍රභාත් පීරිස් | සම්පත් කේන්ද්‍රයේ සේවය කිරීම. |
| | | කේ. ජයසංඛ මධුශාන් පීරිස් | JCB සහායක ලෙස කටයුතු කිරීම. |
| | | ජී. අනුර කුමාර | PT - 8494 රථයේ රියදුරු ලෙස සේවය කිරීම. |
| | | එම්.ජී. ඩිල්කි නවෝදා | අටුළුගම මෛත්‍රී පෙර පාසල ඩෙංගු පරීක්ෂා කිරීම. |

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ජී.දිලාන් රසික මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XXI** ව්‍යාපෘති පදනම මත බඳවා ගත් සේවකයින් යොදා පංචකර්ම ව්‍යාපෘතියේ 2022.09.01 දින සිට 2022.09.30 දින දක්වා පහත සඳහන් වැඩ වාර්තාව පිළිගැනීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඉහත නම් සඳහන් සේවකයින් කරන ලද සේවාවන් පහතින් දැක්වේ.

| අනු අංකය | දිනය | යෙදවූ සේවකයින් | කාර්යය / විස්තරය |
|---|---|---|---|
| 1 | 2022.09.01 | ජී.එස්.ආර්. සිල්වා | තුණ්ඩු නිකුත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම, පිරිසිදු කිරීම. |
| | | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, පිරිසිදු කිරීම. |
| | | ඒ.ඩී.එම්. පෙරේරා | පිරිසිදු කිරීම, ලිපිලේඛන නඩත්තුව. |
| | | ඩී.බී.එස්. වික්‍රම | තුණ්ඩු නිකුත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම, පිරිසිදු කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර කිරීම. |
| 2 | 2022.09.02 | පී.එස්.එම්.යූ. තිසේරා | පිරිසිදු කිරීම, පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | තුණ්ඩු නිකුත් කිරීම, පිරිසිදු කිරීම, ශල්‍ය සායනයට සහාය වීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ තෙල් බැදීම. |
| | | ඒ.ඩී.එම්. පෙරේරා | වෛද්‍ය අධීක්ෂණය යටතේ තෙල් බැදීම, තුණ්ඩු නිකුත් කිරීම, ලිපිලේඛන නඩත්තුව. |
| 3 | 2022.09.03 | ඩී.බී.එස්. වික්‍රම | තුණ්ඩු නිකුත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම, ලිපිලේඛන නඩත්තු කිරීම. |
| | | ඒ.ඩී.එම්. පෙරේරා | මහබෙල්ලන සායනයට සහභාගී වීම. |
| 4 | 2022.09.05 | ඒ.ඩී.එම්. පෙරේරා | මාසික වාර්තාව සැකසීම, ලිපිලේඛන නඩත්තුව. |
| | | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, පිරිසිදු කිරීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම, තුණ්ඩු නිකුත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | තුණ්ඩු නිකුත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම, මාසික වාර්තාව සැකසීම. |
| 5 | 2022.09.06 | ඒ.ඩී.එම්. පෙරේරා | ලිපිලේඛන නඩත්තුව, මාසික වාර්තාව සැකසීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | මාසික වාර්තාව සැකසීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහභාගී වීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | තුණ්ඩු නිකුත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| 6 | 2022.09.07 | ඒ.ඩී.එම්. පෙරේරා | මහබෙල්ලන සායනයට සහභාගී වීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | ලිපිලේඛන නඩත්තුව, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහභාගී වීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | තුණ්ඩු නිකුත් කිරීම, ඖෂධ ඇසුරුම් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| | | පී.එස්.එම්.යූ. තිසේරා | තුණ්ඩු නිකුත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම, පරිගණකයට දත්ත ඇතුලත් කිරීම. |
| 7 | 2022.09.08 | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, තුණ්ඩු නිකුත් කිරීම. |
| | | ඒ.ඩී.එම්. පෙරේරා | ලිපිලේඛන නඩත්තුව, මාසික වාර්තාව සැකසීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | තුණ්ඩු නිකුත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| 8 | 2022.09.09 | ඒ.ඩී.එම්. පෙරේරා | ලිපිලේඛන නඩත්තුව, මාසික වාර්තාව සැකසීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| | | පී.එස්.එම්.යූ. තිසේරා | තුණ්ඩු නිකුත් කිරීම, පරිගණකයට දත්ත ඇතුලත් කිරීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම, සායනයට සහාය වීම. |
| 9 | 2022.09.12 | පී.එස්.එම්.යූ. තිසේරා | තුණ්ඩු නිකුත් කිරීම, පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| | | ඒ.ඩී.එම්. පෙරේරා | වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම, ඖෂධ ඇසුරුම් කිරීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම, තුණ්ඩු නිකුත් කිරීම. |
| 10 | 2022.09.13 | ඒ.ඩී.එම්. පෙරේරා | ලිපිලේඛන නඩත්තුව, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| | | පී.එස්.එම්.යූ. තිසේරා | පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම, පරිගණකයට දත්ත ඇතුලත් කිරීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | තුණ්ඩු නිකුත් කිරීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| 11 | 2022.09.14 | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, තුණ්ඩු නිකුත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| | | ඒ.ඩී.එම්. පෙරේරා | මහබෙල්ලන සායනයට සහභාගී වීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම, තුණ්ඩු නිකුත් කිරීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | තුණ්ඩු නිකුත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| 12 | 2022.09.15 | ඒ.ඩී.එම්. පෙරේරා | තුණ්ඩු නිකුත් කිරීම, ලිපිලේඛන නඩත්තුව, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| | | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, තුණ්ඩු නිකුත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | තුණ්ඩු නිකුත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| 13 | 2022.09.16 | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| | | ඒ.ඩී.එම්. පෙරේරා | තුණ්ඩු නිකුත් කිරීම, ලිපිලේඛන නඩත්තුව. |
| | | ඩී.බී.එස්. වික්‍රම | තුණ්ඩු නිකුත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | ශල්‍ය සායනයට සහාය වීම. |
| 14 | 2022.09.17 | ඒ.ඩී.එම්. පෙරේරා | මහබෙල්ලන සායනයට සහභාගී වීම. |
| 15 | 2022.09.20 | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| | | ඒ.ඩී.එම්. පෙරේරා | ලිපිලේඛන නඩත්තුව. |
| | | ඩී.බී.එස්. වික්‍රම | වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | තුණ්ඩු නිකුත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| 16 | 2022.09.21 | ඒ.ඩී.එම්. පෙරේරා | මහබෙල්ලන සති සායනයට සහභාගී වීම. |
| | | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ ලබාදීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | තුණ්ඩු නිකුත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| 17 | 2022.09.22 | ඒ.ඩී.එම්. පෙරේරා | ලිපිලේඛන නඩත්තු කිරීම. |
| | | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, ලිපිලේඛන නඩත්තු කිරීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | තුණ්ඩු නිකුත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ ලබාදීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ ලබාදීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| 18 | 2022.09.23 | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, ලිපිලේඛන නඩත්තු කිරීම. |
| | | ඒ.ඩී.එම්. පෙරේරා | ලිපිලේඛන නඩත්තු කිරීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | තුණ්ඩු නිකුත් කිරීම, ශල්‍ය සායනයට සහාය වීම. |
| 19 | 2022.09.24 | ඒ.ඩී.එම්. පෙරේරා | මහබෙල්ලන සති සායනයට සහභාගී වීම. |
| 20 | 2022.09.26 | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| | | ඒ.ඩී.එම්. පෙරේරා | තුණ්ඩු නිකුත් කිරීම, ලිපිලේඛන නඩත්තු කිරීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | තුණ්ඩු නිකුත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| 21 | 2022.09.27 | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | තුණ්ඩු නිකුත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | තුණ්ඩු නිකුත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| 22 | 2022.09.28 | ඒ.ඩී.එම්. පෙරේරා | මහබෙල්ලන සති සායනයට සහභාගී වීම. |
| | | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| | | ජී.එස්.ආර්. සිල්වා | තුණ්ඩු නිකුත් කිරීම, වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| 23 | 2022.09.29 | ජී.එස්.ආර්. සිල්වා | පිරිසිදු කිරීම, තුණ්ඩු නිකුත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| | | ඒ.ඩී.එම්. පෙරේරා | පිරිසිදු කිරීම, ලිපිලේඛන නඩත්තුව, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| | | පී.එස්.එම්.යූ. තිසේරා | තුණ්ඩු නිකුත් කිරීම, පිරිසිදු කිරීම, පරිගණකයට දත්ත ඇතුලත් කිරීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම. |
| 24 | 2022.09.30 | ජී.එස්.ආර්. සිල්වා | ශල්‍ය සායනයට සහාය වීම, තුණ්ඩු නිකුත් කිරීම, පිරිසිදු කිරීම. |
| | | පී.එස්.එම්.යූ. තිසේරා | පරිගණකයට දත්ත ඇතුලත් කිරීම, පිරිසිදු කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |
| | | ඒ.ඩී.එම්. පෙරේරා | තුණ්ඩු නිකුත් කිරීම, පිරිසිදු කිරීම, ලිපිලේඛන නඩත්තු කිරීම. |
| | | ඩී.බී.එස්. වික්‍රම | වෛද්‍ය අධීක්ෂණය යටතේ ඖෂධ නිකුත් කිරීම, පංචකර්ම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර සඳහා සහාය වීම. |

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XXII** බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රදේශයේ මුළු ජනගහණය 126850ක් පමණ වන අතර බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ අදිකාරීපත්තුව උප කාර්යාලයට අයත් නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ කාර්ය මණ්ඩලය මගින් නඩත්තු කරනු ලබන ඔසු උයන හා එහි ස්ථාපිත පංචකර්ම මධ්‍යස්ථානය හා ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා දිනකට රෝගීන් 100ක් පමණ පැමිණෙන අතර බල ප්‍රදේශයේ ජනතාව නීරෝගිමත් පිරිසක් බවට පත් කිරීම හා ජනතාවට වඩා ඵලදායී සේවාවක් සැපයිම සඳහා 2022.05.04 දින සිට ආරම්භ කරන ලද ඔසු උයන පංචකර්ම මධ්‍යස්ථානයේ පංචකර්ම සහයක සනීපාරක්ෂක හා උද්‍යාන අලංකරණ කටයුතු සඳහා ව්‍යාපෘති පදනම මත බඳවාගත් සේවකයින් 06 දෙනාගේ සේවා කාලය 2022.11.03 දිනෙන් අවසන් වන බැවින් 2022.11.09 දින සිට තවත් මාස 06කින් දීර්ඝ කිරීමටත් එම සේවකයින් 06 දෙනාගේ දීමනා වශයෙන් රු.1,533,870.00 මුදලක් දීමනා ලෙස සහා අරමුදලින් වියදම් දැරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06-01-XXIII** සංවර්ධනය කිරීමට යෝජිතව තිබූ වැල්මිල්ල ජය මාවත පොදු නාන ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම යන ව්‍යාපෘතියේ අමුද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාම මත සංවර්ධන කටයුතු අඩාල විය. ඒ සඳහා ඍජු ශ්‍රමය යටතේ සහා අරමුදල් මගින් ද්‍රව්‍ය මිලදී ගෙන සංවර්ධනය කිරීමට සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

**යෝජනාව ගරු උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

<u>උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
ගරු සභාපතිතුමනි, මේ ළිඳ අලුත්වැඩියා නොකළහොත් විශාල ඛේදවාචකයක් ඇති වෙන්න ඉඩ තියෙනවා. ඊට එහා පැත්තේ තට්ටු දෙකේ ගෙයක් තියෙනවා. ඒ ගේ ගිලා බැසීමේ අවධානමක් තියෙනවා.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
මේ ව්‍යාපාතියේ වැඩ ඉක්මනට ආරම්භ කරමු. අමුද්‍රව්‍යවල මිල ඉහළ යාමත් කොන්ත්‍රාත්කරුවන් මේ ව්‍යාපෘතිය භාර නොගැනීමත් හේතුවෙන් මේක ප්‍රමාද වුනේ. මෙහි පවතින අවධානමත් එක්ක එහි වැඩ අවසන් කරමු.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06-01-XXIV** පතහවත්ත සිට කහඹිලියාවත්ත දක්වා වන මාර්ගය පිළිසකර කිරීම යන ව්‍යාපෘතිය සඳහා මුළු ඇස්තමේන්තු මුදල වන රු.4,480,000.00ක මුදලක් වැය වන බැවින් හා අමුද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාම මත එම මාර්ගයෙන් කොටසක් සංවර්ධනය කිරීමට සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

**යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොසාන් රාජිත මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>
මේ පාරේ වලවල් ටිකට සම්පූර්ණයෙන්ම ප්‍රිමික්ස් ටික දාගන්න බැරිද? ඒ පාරේ යන්නම බැහැ.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
පතහවත්ත පන්සල පැත්තෙන් මේ ව්‍යාපෘතිය ආරම්භ කරමු. අපි බලමු කොච්චර දුරට මේ ව්‍යාපාතියෙන් කරන්න පුළුවන්ද කියලා. ඉතුරු ටිකට ප්‍රිමික්ස් දාලා පුළුවන් ප්‍රමාණයක් කරමු. ප්‍රිමික්ස් දාලා ඒ පාර නඩත්තු කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තමයි තියෙන්නේ.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොසාන් රාජිත මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06-01-XXV** රයිගම ග්‍රාම නිලධාරී වසමට අයත් සුසාන භූමියේ කුටීර තාප්පය අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06-01-XXVI** වැව්ට ග්‍රාම නිලධාරී වසමට අයත් වැව්ට වැව ඉස්මත්තේ ඉදි කිරීමට යෝජිත ළමා උද්‍යානයේ මායිම වැටක් ඉදි කිරීමට සහා අරමුදලින් වියදම් දැරීමට සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XXVII** සෘජු ශ්‍රම පදනම යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් පවත්වාගෙන යාමේදී පුහුණු කම්කරුවන් සපයා ගැනීම ගැටළු සහගත වී ඇත. ඒ අනුව 2022.02.10 වන දින නිකුත් කරන ලද මාර්ග ගාස්තු උප ලේඛනය පරිදි දිනක පුහුණු කම්කරුවෙකුගේ වැටුප පැය 8ක් සඳහා රු. 2700.00ක් ලෙස සඳහන් වේ. තවද දිස්ත්‍රික් මිල ගණන් අනුව පෙදරේරුවකු සඳහා දිනකට රු. 3000.00 – 4000.00ක මුදලක් ගෙවනු ලබයි. දැනට ප්‍රාදේශීය වශයෙන් පවතින මිල ගණන් අනුව රු.3500.00ක දෛනික ගෙවීම යටතේ සෘජු ශ්‍රමය ලබා ගැනීම සුදුසු බවටත්, වැය වන ඇස්තමේන්තු මුදල ගණනය කර එමගින් 20%ක අත්තිකාරම් මුදලක් ලබාගෙන දෛනිකව අවසන් කරන කාර්යයන් මැනීම තාක්ෂණ නිලධාරී සිදු කිරීම මත හා ඇස්තමේන්තුව අනුව අදාළ පෙදරේරු වෙත සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XXVIII** 2022 වර්ෂයේ ඇස්තමේන්තු කර ඇති පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|---|
| සභා අරමුදල් 2022 | | |
| 01 | පතහවත්ත සිට කහඹිලියයාවත්ත දක්වා වන මාර්ගය පිළිසකර කිරීම - 1 අදියර | 1,826,000.00 |
| 02 | තල්පිටිබද්ද උප කාර්යාලයේ ඉදිරිපස ගේට්ටුව අළුත්වැඩියා කිරීම (සෘජු ශ්‍රමය යටතේ සිදු කරනු ලබයි) | 74,166.00 |
| 03 | මහවිල උස්වත්ත තිලකරත්න මහතාගේ නිවස හා අනෙක් නිවාස පිහිටි මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 1,060,000.00 |
| 04 | මාදුපිටිය රාළහාමිවත්ත මාර්ගය ඉදිරිපිට ඇති අතුරු මාර්ගයේ අවසාන කොටස සංවර්ධනය කිරීම (සංශෝධිත) | 910,000.00 |
| 05 | මස්විල වඩු පාසල පාර අබලන් වූ ස්ථාන නැවත සකස් කිරීම | 656,000.00 |
| 06 | සමරනායකපුර ගොවිජනපදය අලුත් පාර අබලන්ව පවතින කොටස ප්‍රතිසංස්කරණය කිරීම. | 1,658,000.00 |
| 07 | බණ්ඩාරගම සතිපොල යකඩ කනු දිරාපත් වීම වැලැක්වීම සඳහා යකඩ ආවරණ යෙදීම. (සෘජු ශ්‍රමය යටතේ සිදු කරනු ලබයි) | 90,000.00 |
| 08 | කිරිහලෙහි ඉතිරි වැඩ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලයිස්තුව හා මිනිස් ශ්‍රමය සඳහා (සෘජු ශ්‍රමය යටතේ සිදු කරනු ලබයි) | 119,820.00 |

**යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රනීත් වැලිවිටගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

<u>සංශෝධිත යෝජනාව</u>

2022 වර්ෂයේ ඇස්තමේන්තු කර ඇති පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|---|
| සභා අරමුදල් 2022 | | |
| 01 | පතහවත්ත සිට කහඹිලියයාවත්ත දක්වා වන මාර්ගය පිළිසකර කිරීම - 1 අදියර | 1,826,000.00 |
| 02 | තල්පිටිබද්ද උප කාර්යාලයේ ඉදිරිපස ගේට්ටුව අළුත්වැඩියා කිරීම (ඍජු ශ්‍රමය යටතේ සිදු කරනු ලබයි) | 74,166.00 |
| 03 | මහවිල උස්වත්ත තිලකරත්න මහතාගේ නිවස හා අනෙක් නිවාස පිහිටි මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 1,060,000.00 |
| 04 | මාදුපිටිය රාළහාමිවත්ත මාර්ගය ඉදිරිපිට ඇති අතුරු මාර්ගයේ අවසාන කොටස සංවර්ධනය කිරීම (සංශෝධිත) | 910,000.00 |
| 05 | මස්විල වඩු පාසල පාර අබලන් වූ ස්ථාන නැවත සකස් කිරීම | 656,000.00 |
| 06 | සමරනායකපුර ගොවිජනපදය අලුත් පාර අබලන්ව පවතින කොටස ප්‍රතිසංස්කරණය කිරීම. | 1,658,000.00 |
| 07 | බණ්ඩාරගම සතිපොල යකඩ කනු දිරාපත් වීම වැලැක්වීම සඳහා යකඩ ආවරණ යෙදීම. (ඍජු ශ්‍රමය යටතේ සිදු කරනු ලබයි) | 90,000.00 |
| 08 | කිරිහලෙහි ඉතිරි වැඩ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලයිස්තුව හා මිනිස් ශ්‍රමය සඳහා (ඍජු ශ්‍රමය යටතේ සිදු කරනු ලබයි) | 287,397.60 |

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රනීත් වැලිවිටගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XXIX** මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංවර්ධනය කළ යුතු බවට ප්‍රාදේශීය සභාව විසින් මීට පෙර වරින් වර තීරණය කරන්නට යෙදී පහත උප ලේඛන ගත බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ව්‍යාපෘති සාර්ථකව ඉදිකිරීමේ කාර්යය උදෙසා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක සමිති වශයෙන් කොන්ත්‍රාත්කරු පාර්ශවයන් වශයෙන් සලකා මෙම යෝජනාවෙහි පහත උප ලේඛනයෙහි ඇතුළත් වන පරිදි එහි දක්වා ඇති කාල පරිච්ඡේද යටතේ හා ඇස්තමේන්තු වටිනාකම් යටතේ මෙම යෝජනාවේ, කොටසක් වටිනාකම් වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගිවිසුම් කෙටුම්පතට අනුකූලව එකී කොන්ත්‍රාත්කරු/සමිති සමඟ ගිවිසා ගනිමින්, එකී කොන්ත්‍රාත් ඉටු කළ යුතු බවටත්, ඒ සම්බන්ධයෙන් මෙම යෝජනාවේ කොටසක් වූ ගිවිසුමේ කෙටුම්පත උප ලේඛනයෙහි ඇතුළත් නිශ්චිතව දක්වා ඇති කරුණු ඇතුළත් වන පරිදි අදාල ගිවිසුම් කෙටුම්පත් අනුමත කල යුතු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතිය | සමිතිය/කොන්ත්‍රාත්කරු | ගිවිසුම් මුදල (රු) |
|---|---|---|---|
| සභා අරමුදල් 2022 | | | |
| 01 | පතහවත්ත සිට කහඹිලියයාවත්ත දක්වා වන මාර්ගය පිළිසකර කිරීම - 1 අදියර | රයිගම නැගෙනහිර වැඩිහිටි සමිතිය | 1,825,824.39 |
| 02 | බණ්ඩාරගම කිරිහලෙහි අමතර වැඩ සඳහා වන ඇස්තමේන්තුව | කඹුරුගොඩ බටහිර සුවසරණ වැඩිහිටි සමිතිය | 471,691.77 |
| 03 | සමරනායකපුර ගොවිජනපදය අලුත් පාර අබලන්ව පවතින කොටස ප්‍රතිසංස්කරණය කිරීම. | ග්‍රාම සංවර්ධන සමිතිය සමරනායකපුර | 1,657,241.61 |

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් සෙනෙවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-02.ගරු සභාපති එච්.ඒ.එච්. දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමාගේ හදිසි යෝජනා :-**

**6-2-I** බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි දෙකක පැවැත්වීමට යෝජිත "ගමේ කඩේ" හා "විස්" පරිගනක පුහුණු මධ්‍යස්ථානයේ සවි කිරීම සඳහා වායු සමීකරණ යන්ත්‍ර සපයා සවි කිරීම හා අඳුන්වැන්න ආදාහනාගාරයේ අළුත්වැඩියා කටයුතු සඳහා මිළ ගණන් කැඳවීම සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන දැන්වීම ජාතික පුවත්පත් තුනක භාෂාත්‍රයෙන් පල කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6-2-II** බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට අයත් මැදගම අඳුන්වැන්න ආදාහනාගාරය අළුත්වැඩියා කිරීම සඳහා NRAD ආයතනයේ ලියාපදිංචි ආයතන වලින් මිල ගණන් ලබා ගැනීමට සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6-2-III** 2022 වර්ෂයේ ඇස්තමේන්තු කර ඇති පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|---|
| සභා අරමුදල් 2022 | | |
| 01 | බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට අයත් මැදගම අඳුන්වැන්න ආදාහනාගාරය අළුත්වැඩියා කිරීම. | 977,500.00 |
| 02 | වැල්මිල්ල ජය මාවත පොදු නාන ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම | 1,140,000.00 |
| 03 | හද්දාගොඩ වටරවුම් පාරෙහි 1 වන පටුමගේ අවසාන කොටස සංවර්ධනය කිරීම. (ඍජු ශ්‍රමය යටතේ ව්‍යාපෘතිය ඉටු කරනු ලැබේ) | 872,000.00 |

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6-3-I** නිව්ඩාව පුවක්වත්ත මාර්ගයේ ප්‍රාදේශීය සභාව මගින් සංවර්ධනය කර ඉතිරි වී ඇති මීටර් 12ක පමණ ප්‍රමානයක් තාර දමා සංවර්ධනය කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ප්‍රියන්ත අල්විස් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6-4-I** පිංවල කනත්ත පාර දැඩි ලෙස අබලන්ව පවතින බැවින් එම මාර්ගය කුමන හෝ මාධ්‍යක් යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.මංජුල මනෝහාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**07. කාරක සභා වාර්තා පිළිබඳ සමාලෝචනය කිරීම -**

**7.1**. 2022.09.08 දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව සභාගත කිරීම (ඇමුණුම් අංක 02)
**7.2**. 2022.09.08 දින පවත්වන ලද ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභාගත කිරීම. (ඇමුණුම් අංක 03)
**7.3**. 2022.09.23 දින පවත්වන ලද පරිසර හා පොදු පහසුකම් කමිටු වාර්තාව සභාගත කිරීම. (ඇමුණුම් අංක 06 )
**7.4**. 2022.09.28 දින පවත්වන ලද කර්මාන්ත හා කාර්මික සේවා කමිටු වාර්තාව සභාගත කිරීම. (ඇමුණුම් අංක 07)
**7.5**. 2022.09.30 දින පවත්වන ලද නිවාස හා පොදු පහසුකම් කමිටු වාර්තාව සභාගත කිරීම. (ඇමුණුම් අංක 08 )
**7.6**. 2022.05.25 දින පුස්තකාල උපදේශන කමිටුවේ සංක්ෂිප්ත වාර්තාව සභාගත කිරීම (ඇමුණුම් අංක 09)
**7.7**. 2022 සැප්තැම්බර් මස වීථි පහන් නඩත්තු කිරීමේ ප්‍රගතිය සම්බන්ධ වාර්තාව සභාගත කිරීම.
**7.8**. 2022 සැප්තැම්බර් මස ආයුර්වේද බෙහෙත්ශාලාවේ ආදායම් ප්‍රගතිය සම්බන්ධ වාර්තාව සභාගත කිරීම.
**7.9**. 2022 සැප්තැම්බර් මස බණ්ඩාරගම ඥාන ප්‍රදීප පුස්තකාලයේ /තල්පිටිබද්ද මහජන පුස්තකාලයේ මාසික සංඛ්‍යාලේඛන වාර්තාව සභාගත කිරීම.
**7.10**. 2022 සැප්තැම්බර් මස මාර්ග පිරිසිදු කිරීමේ ප්‍රගතිය සම්බන්ධ වාර්තාව සභාගත කිරීම.
**7.11.** 2022 සැප්තැම්බර් මස මාර්ග ප්‍රිමික්ස් කිරීමේ ප්‍රගතිය සම්බන්ධ වාර්තාව සභාගත කිරීම.
**7.12.** 2022 සැප්තැම්බර් මස ආදාහනාගාර තුළ දේහආදාහනය පිලිබඳ වාර්තාව සභාගත කිරීම.

**08. සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය කිරීම -**

**7-1.** 2022 ජූලි මස ආදායම් වියදම් වාර්තාව
**7-2.** 2022 ජූලි මස ලැබීම් විග්‍රහය
**7-3.** 2022 ජූලි මස ගෙවීම් විග්‍රහය
**7-4.** 2022 ජූලි මස හිඟ ශේෂ වාර්තාව සභාගත කිරීම.
(ඇමුණුම් අංක 10)

**09. තව දුරටත් සභාව තීරණය කරන ලදුව න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති කරුණු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් සෙනෙවිරත්න මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

ගරු සභාපතිතුමනි, පිංවල කනත්ත පාර සම්බන්ධව විවිධ අවස්ථාවලදී යෝජනා කාපට් කරන්න ඉදිරිපත් වුනා.නමුත් ඒවා සිද්ධ වුනේ නැති නිසා මේ පාර යන්නම බැරි තත්ත්වයට අබලන් වෙලා තියෙනවා. ඒ නිසා කුමන හෝ ක්‍රමයක් අනුගමනය කරලා අත්‍යාවශම ව්‍යාපෘති කරන්න පුළුවන් කියන අවසරය ඇතුව ඒ පාරට ප්‍රිමික්ස් ටිකක් දාලා හරි දෙන්න කියලා ඉල්ලා සිටිනවා. අනෙක් කාරණය වඳුරාමුල්ල බටහිර ග්‍රාම නිලධාරී වසමේ නිසල මාවතේ කෙළවර වැසි වතුර එක්රැස් වෙනවා. ඒක සම්බන්ධව සංවර්ධන යෝජනාවක් ක්‍රියාත්මක කරන්න බැරි වුනා. බටයක් දාලා ඒ වතුර ටික කානුවට බැහැලා යවන්න කටයුතු කරලා දෙන්න කියන ඉල්ලීමත් කරනවා. ඒ වගේම අපේ පුස්තකාල ලබාගත් ජයග්‍රහණ සම්බන්ධව සතුටු වෙනවා. ඒ සඳහා කැපවෙච්ච කාර්ය මණ්ඩලයට ස්තූතිවන්ත වෙනවා.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
"සුවබර හෙටක් ප්‍රීතිමත් ජීවිතයක්" උදෙසා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ඉහළ නැංවීම සඳහා බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව මගින් වැඩසටහනක් සංවිධානය කළා. මේක සෞඛ්‍ය අමාත්‍යංශයේ අනුමැතියට යොමු කරලා තියෙනවා. මේ වැඩසටහන සම්බන්ධයෙන් ඔබතුමන්ලාව දැනුවත් කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන්ට අවස්ථාව ලබා දීමට සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරනවා.

**ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා යෝජනා කර ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව.11.49ට සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලදි.**

(කාරක සභා අවස්ථාවේදී මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් "සුවබර ජීවිතයක්" නමින් ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන ලද අතර පහත ආකාරයෙන් අදහස් ඉදිරිපත් වීම සිදු විය.)

<u>මහජන සෞඛ්‍ය පරීක්ෂක - දිලූප ජයවර්ධන මයා</u>
"සුවබර හෙටක් ප්‍රීතිමත් ජීවිතයක්" ව්‍යාපෘතිය යටතේ බලාපොරොත්තු වෙන්නේ වර්තමානයේ ජනතාවගේ බෝ නොවන රෝග පාලනය හා වැළැක්වීමයි. මෙහිදී ජනතාව දැනුවත් කිරීමක් කරනවා.මෙහිදී මන්ත්‍රීවරයාගේ මූලිකත්වයෙන් යුතුව ගමක ජනතාව දැනුවත් කිරීමක් කරලා බෝ නොවන රෝග වලට කවුද බෙහෙත් ගන්නේ මොනවද ගන්න බෙහෙත් කියලා සංගනනයක් සිදු කරනු ලබනවා. ඒ අනුව අපි එක් මාසයක් ගානේ ගමට ඇවිත් බෙහෙත් දෙනවා. දෙවන මාසයේ රෝහළට ඇවිත් බෙහෙත් ගන්නවා. මේ ආකාරයට මාසයක් ඇර මාසයක් මේ දේ අපි සිදු කරනවා. ඒ අනුව බෝ නොවන රෝග පාලනය කර 2030 වර්ෂය වෙද්දී දරුවන්ව බෝ නොවන රෝග වලින් පාලනය කරන්න පුළුවන් රටක් බවට පත් කරන්න බලාපොරොත්තු වෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී දීපානි කඳනආරච්චි මැතිණිය - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය</u>
මෙතුමාගේ කතාවෙන් කියවුනා කොට්ඨාශ මට්ටමින් රෝගීන් දැනුවත් කරනවා කියලා. මමත් සිංහ සමාජයේ සිංහ දිස්ත්‍රික්කයක් නියෝජනය කරමින් වසර ගණනක ඉදලා කටයුතු කරනවා. මම මගේ පුද්ගලික ධනයෙන් මේ සඳහා අවශ්‍ය ස්ක්‍රීන් පරීක්ෂන සිදු කරනවා. මට පුළුවන් මගේ කොට්ඨාශයේ ඕනෑම කෙනෙකුගේ ස්ක්‍රීන් පරීක්ෂණ කරලා දෙන්න. මම ඒක නොමිලේ කරන්නේ. ඔබතුමන්ලා මා වෙත යොමු කරනවා නම් මට පුළුවන් ඒ කාර්ය සඳහා උදව් වෙන්න. මේ දේ අපිට පාසල් මට්ටමින් උනත් කරන්න පුළුවන්.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>
සායනික සේවාවකුත් එතනින් සිද්ධ වෙනවද?නැත්නම් උපදේශන සේවාව විතරද?

<u>මහජන සෞඛ්‍ය පරීක්ෂක - දිලූප ජයවර්ධන මයා</u>
එක් කොට්ඨාශයක තියෙන ග්‍රාම සේවා වසම් අතරින් එක් වසමක් අරගෙන ඒකෙ තියෙන ක්‍රියාකාරී සිවිල් සංවිධාන හරහාජ තමයි දැනුවත් කිරීම කරන්නේ. ඒ දැනුවත් කිරීම කරලා අපි බලාපොරොත්තු වෙනවා ප්‍රතිකාර කරන්න. මෙහිදී බලාපොරොත්තු වන ප්‍රධානම දේ තමයි ගර්භනී මව්වරුන්ට කුසේ සිටින දරුවා නීරෝගීමත් දරුවෙකුද කියලා බලා ගන්න ස්කෑන් පහසුකම් නොමිලේ ලබා දෙන එක. ඒ වගේම බෝ නොවන රෝග හඳුනාගත් දරුවන්ට කාඩ් එකක් අපි ලබා දීමට බලාපොරොත්තු වෙනවා. දරුවන්ට දිගටම ප්‍රතිකාර කරලා දරුවාට අවුරුදු 20ක් වෙන කොට නීරෝගී දරුවෙකු විදිහට සමාජයට එනවා. මන්ත්‍රීවරුන්ගෙන් බලාපොරොත්තු වෙන්නේ ඔබතුමන්ලා තමයි මේ සම්පූර්ණ වැඩසටහන සංවිධානය කරන්නේ. ඔබතුමන්ලා තමයි දැනුවත් කිරීම් කරලා ජනතාව එකතු කිරීම කරන්නේ. ඒ අනුව අපිට බලන්න පුළුවන් කොච්චර රෝගීන් ප්‍රමාණයක් ඉන්නවද කියලා. ඊට පස්සේ ඒ තොරතුරු ටික අමාත්‍යංශයට යවන්නේ.

**ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා යෝජනා කර ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ප.ව.12.05 ට කාරක සභාව නැවත මහ සභා අවස්ථාවක් බවට පත් කරන ලදි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ප්‍රියන්ත අල්විස් මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
ගමක සාමාන්‍යයෙන් බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර ගන්න රෝගීන් ඉන්නවා. ඔය පරීක්ෂණ ටික ගමක කරන්න ගියහම වැඩිහිටි සහ ළමයි එක්ක 4000ක විතර ප්‍රමාණයක් වෙනවා. ප්‍රායෝගිකව 4000කට එක දවසින් කරන්න බෑ. එතකොට කොහොමද ඔය තෝරාගැනීම් කරන්නේ. තෝරාගන්න මොකක්හරි ක්‍රමයක් තියෙනවද?

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

මුලින්ම අපි කරන්නේ එක ග්‍රාමසේවා වසමක තියෙන සිවිලි සංවිධාන මැදිහත් කරගෙන මේ සමීක්ෂණය සිදු කර ඒ ලබා ගන්න තොරතුරු සෞඛ්‍ය අමාත්‍යාංශයට යවනවා.සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ අපි සාකච්චා කරලා තියෙන්නේ අපිට අවශ්‍ය වෛද්‍යවරුන්,බෙහෙත් අවශය සියලු දේ සපයන්න සෞඛ්‍ය අමාත්‍යාංශය පොරොන්දු වෙලා තියෙනවා. එක ග්‍රාමසේවා කොට්ඨාශයක එක දිනකින් කරන්න බැරි වෙයි. ඒක අපි වර්ගීකරණය කර ගන්න ඕනා. ප්‍රළමු පාර තෝරගන්න ඕන කාවද දෙවන පාර තෝරගන්න ඕන කාවද කියලා. ඒක සමීක්ෂනයෙන් පස්සේ තමයි තීන්දු කරන්නේ. ඒ අනුව තමයි මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඞී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>

මේකෙදි දෙමාපියන්ව ඉලක්ක වෙනවට වඩා දරුවන්ව මේ සම්බන්ධව ඉලක්ක වෙන එක හොඳයි. බෝ නොවන රෝග හැදෙන්නේ අවිධිමත් ජීවන රටාව අවිධිමත් ආහාර රටාව  මානසික පීඩනය නිසා. මේකෙදී දරුවන්ව නියාමනය කරන්න වැඩපිළිවලක් තියෙනවා නම් ඒක වටිනවා. මුළු කොට්ඨාශයේම කට්ටිය අරගෙන කරන්න අමාරු වෙයි. නමුත් ප්‍රමුඛතාවය හදුනාගෙන ඒ කණ්ඩායමට හරි කරන්න පුළුවන් නම් ලොකු දෙයක් හැටියට මම නම් දකින්නේ.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

මේකෙදී අනාගත පුරපුර ගැන ඉලක්කයක් තියෙනවා. බෝ නොවන රෝග බොහෝ වෙලාවට පරම්පරාවට යන්න පුළුවන්. එතනදී බාල පරම්පරාව දැනුවත් කරලා දරුවන්ට උපදෙස් දෙන්න ප්‍රතිකාර කරන්න පුළුවන් නම් ඒකට මේක උදව්වක් වෙයි කියලා විශ්වාස කරනවා.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ</u>

රෝගීන්ට නොමිලේ බෙහෙත් ලබා දෙන ක්‍රමයක් අපිට සකසා ගන්න පුළුවන් නම් ගොඩක් වටිනවා. මේකත් තවත් අතරමග නවතින ව්‍යාපෘතියක් නොවී බෝ නොවන රෝග සඳහා අවශ්‍ය බොහෙත් ලබා දෙන්න පුළුවන් නම් ඒක ජනතාවට ලොකු උදව්වක් වෙනවා.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී දීපානි කඳනආරච්චි මැතිණිය - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය</u>

සාමාන්‍යයෙන් රුධිරයේ සීනි ප්‍රමාණයේ අගය 140ට වැඩි රෝගියෙක් මුලින්ම වෛද්‍යවරයෙකුට යොමු කරනවා. ඔවුන්ට එක පාරටම බොහෙත් නිර්දේශ කරන්නේ නෑ. රෝගියා ආහාරවලින් මාසයක් විතර පරිස්සම් වෙලා බලන්න ඕනා රුදිරයේ සීනි ප්‍රමාණය 140ට වැඩි ප්‍රමානයේම තියෙනවද කියලා. එහෙම ඉදලත් රුධිරයේ සීනි ප්‍රමාණය වැඩි නම් ඒ රෝගියාට වෛද්‍යවරයෙක් බොහෙත් නිර්දේශ කරනවා. දරුවන්ට එහෙම එක පාරටම බොහෙත් පාවිච්චි කරන්නේ නෑ. දෙමාපියන්ට දියවැඩියා රෝගය තියෙනවා නම් දරුවන්ට හැදීමේ ප්‍රවනතාව වැඩියි. ඒ නිසා දරුවන්ව ආරක්ෂා කිරීම කළ යුතුයි. ඒ සඳහා ව්‍යාපෘති හරහා දෙමාපියන්ව දැන්වත් කිරීමක් කළ යුතුයි.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ</u>

බණ්ඩාරගම රෝහලේ මානසික රෝගීන්ට කෙටි ආහාර වේලක් ලබා දීම සම්බන්ධව සඳහන් කළා. මම හිතනවා කෙටි ආහාර ලබා දීම තුළින් බෝ නොවන රෝග සෑදීමේ ප්‍රවනතාව වැඩියි. ඒ නිසා මම යෝජනා කරනවා මානසික රෝග සායනය සඳහා කෙටි ආහාර නැතුව කුමන හෝ කැඳවේලක් වගේ පෝෂ්‍යදායී ආහාරයක් දුන්නා නම් හොඳයි කියලා මම හිතනවා.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රනීත් වැලිවිටගේ මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

මේ ව්‍යාපෘතිය හොඳ ව්‍යාපෘතියක්. යෞවන සමාජත් බන්ඩාරගම රෝහලත් එකතු වෙලා වල්ගම,වීදාගම මේ වගේ වැඩසටහනක් කළා. ඒකෙදී අපිට හැංගිච්ච රෝගීන් හදුනාගන්න ලැබුනා. ඒ නිසා මේක හොඳ ව්‍යාපෘතියක්.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඞී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>

අපේ ධූරකාලය දැන් අවසන් වීගෙන එනවා. ලබන මාර්තු වෙන කොට නැවත අලුත් සභාවක් පිහිටුවලා තියෙන්න ඕනා. මැතිවරණයක් අනිවාර්යෙන්ම තැබිය යුතුයි. ලෝකයම මේ සම්බන්ධව ප්‍රකාශ කරන අවස්ථාවේ ජනාධිපතිවරයා ව්‍යවස්ථා සංශෝධනයක් හා ව්‍යුහාත්මක සංශෝධනයක් කරන්න හදනවා. ඒවා කරන්න එතුමාට ජන වරමක් නෑ. එතුමාට ඡන්දයක් නොතියා කල් මරන්න දෙන්නේ නෑ. ඒක ජනතාව සමඟ බේරගන්න ඕනා කියන එක මේ අවස්ථාවේ මතක් කරන්න කැමතියි.

ඒ වගේම කියන්න ඕනා මේ අවුරුදු 4ටම අපිට විදි පහන් දාන්න ලැබුනේ 5ක් විතරයි. සමහර මන්ත්‍රීවරු විදුලි පහන් දානවා අපි දකිනවා.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
අලුතින් විදුලි පහන් දැම්මේ නෑ. අටුළුගම විදුලි පහන් දැම්මේ අටුළුගම මන්ත්‍රීවරු එකතු වෙලා පල්ලියත් සමඟ සම්බන්ධ වෙලා අලුතින් විදුලි පහන් මිලදී අරගෙන තමයි දාන්නේ. මේ දිනවල අලුත්වැඩියා කිරීම් පමණයි කරන්නේ. කොට්ඨාශවල මන්ත්‍රීවරුන්ගේ දැනුවත් කිරීම මත කඩිනමින්ම අලුත්වැඩියා කටයුතු සිදු කරනවා. ඊට පස්සේ බලමු අලුතින් සවි කිරීම් කරන්න.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>
අපි මහජන නියෝජිතයින් විදිහට අවුරුදු 3ක් තිස්සේ අප් ගම්වල මිනිස්සු ලයිට් එකක් ඉල්ලනවා. අඩුම තරමේ සභා කාලය අවසන් වෙන්න ළඟ නිසා හරි අපිට ලයිට් 5ක්වත් තව ලබා දෙන්න.
මම ඉතාමත් කණගාටුවෙන් උනත් කියන්න ඕනා පසුගිය දිනක ඔබතුමාගේ අවසරය අරගෙන මෝටර්ග්‍රේඩරය ඉල්ලා ගත්තා. මේ කාරණය විශේෂයෙන්ම සුනේත්‍රා මන්ත්‍රීතුමියට කියන්න කැමතියි මම කාන්තාවන්ගේ අයිතින් සම්බන්ධව සහ කාන්තාවන්ට තියෙන පසුගාමී ආකල්ප සම්බන්ධව මම පෙනී සිටින, කාන්තාවන් පුරුෂයින්ට වඩා ඉවසීම අතින් දක්ෂතා අතින් ඉහලින් සිටිනවා කියලා පෞද්ගලිකව විශ්වාස කරන ප්‍රසිද්ධියේ කියන පුද්ගලයෙක්. ඒ ගරුත්වය මම කාන්තාවන්ට හැමදාම ලබා දෙනවා. ඒ වගේම මේ සමාජය තුල කාන්තාවට තියෙන වගකීමෙන් එපිටට ගිහිල්ලා නරක විදිහට හැසිරෙනවා නම් ඒ සම්බන්ධව කතා කරන්නත් මම පසුබට වෙන්නේ නෑ.
මේ අවුරුදු 4ටම මම මෝටර්ග්‍රේඩරය ඉල්ලගත්ත එකම අවස්ථාව ඒක. ඒ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම අනුව තමයි මම ඒ කාර්ය සිදු කළේ. ඒ කාර්ය සිදු කරන අවස්ථාවේ මම එතනට ගියේවත් නෑ. ඒවගේ දේකින් දේශපාලන වාසි ගන්න යන්නේ නෑ. ඒ අවස්ථාවේ සුනේත්‍රා මන්ත්‍රීතුමියත් ඒ ස්ථානයට ගිහිල්ලා එතුමිය තමයි මැෂින් එක එව්වේ කියලා එතන හිටපු ජනතාවට කියලා තිබුනා. මම ඒ අවස්ථාවේම එතුමියට දුරකථනයෙන් කතා කළා ඒ අවස්ථාවේදී මටත් එතුමිය කියනවා මේක එතුමිය කරන වැඩක් කියලා. අවසානයේ කවුරු හරි කැලෑ පත්තරයක් ගහලා තිබුනා පිටින් ඇවිත් කොට්ඨාශවල වැඩ කරන්න එපා කියලා. ඒ කවුරු උනත් දැන ගන්න ඕනා මේ සභාවට අපේ පක්ෂයෙන් පත් වුනේ මන්ත්‍රීවරු දෙදෙනයි. ලයිස්තුවෙන් ආව අපි දෙන්නට වෙන් වෙච්ච කොට්ඨාශයක් නෑ. මේ බණ්ඩාරගම බල ප්‍රදේශයේම මිනිස්සු වෙනුවෙන් අපි පෙනී සිටිනවා. දේශපාලනය කරද්දී එහි මූලික හරයන් නීති රීති සම්ප්‍රදායන් අපි ඉගෙන ගන්න ඕනා. අනුන් කරන වැඩකට ගිහින් මැදිහත් වෙලා ඒ මදිවට මම කතා කළාම මටත් බොරු කියලා කැලෑ පත්තර ගහලා ලැජ්ජ නැති වැඩ. මේවා කාන්තාවකට ගැලපෙන්නේ නැති දේවල්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ජී.සුනේත්‍රා මැතිණිය - එක්සත් ජාතික පක්ෂය</u>
ගරු සභාපතිතුමනි, ශාන්ති මාවතේ වෙල දෙපස සුද්ද කරන්න කියලා මම 2018 වර්ෂයේ ඉදන් තමයි යෝජනා කරන්නේ. කමිටු රැස්වීම් කීපයකදීත් මම ඒ සම්බන්ධව කතා කළා. මම මේ සම්බන්ධව සභාවේදී කමිටුවලත් වාර 15ක් විතර කතා කරලා තියෙනවා. මේ පාර සමිත් මන්ත්‍රීතුමා කරන්න කලින් සභාවේ තාක්ෂණ නිලධාරීතුමිය ගිහින් මැනගෙන ඇවිල්ලා තියෙනවා ඒ පාර සංවර්ධනය කරන්න.  මම එදා ඉදලාම මම නියෝජනය කරන කාන්තා සමිති ළමා සමාජ සම්බන්ධ කරගෙන හැම වර්ෂයක මේ පාර සුද්ද කරන කටයුත්ත කරනවා. මේ පාර මගේ පුහුණුව නිසා මට ඒක කරන්න බැරි වුනා. මම නම් කැලෑ පත්තර ගැහුවේ නෑ නමුත් මට නම් චන්ඩි තුන්දෙනෙක් එව්ව. සභාපතිතුමනි අපිවත් දැනුවත් නොකර එහෙම කොට්ඨාශයක වැඩ කරන්න දෙන්න එපා. සමිත් මන්ත්‍රීතුමා ප්‍රගතිශිලී පුද්ගලයෙක් නම් පාර සුද්ද කරන අවස්ථාවේ මටත් කියන්න තිබුනා. එතන හිටපු අයට මම ප්‍රකාශ කළා මේක මගේ යෝජනාවක් කියලා ඒකෙ වැරැද්දක් නෑනේ. මේ පාර සකස් කිරීමේ මූලික කටයුත්ත සභාපතිතුමා කරලා දුන්නා. ඊට එහා යන්න කලින් තමයි මේ සිදුවීම වුනේ. සමිත් මන්ත්‍රීතුමා කිව්වා මම එතන ලකුණු දා ගන්න යනවා කියලා. ඒ අවස්ථාවේ එතන හිටපු හතර දෙනාට තමයි මම කිව්වේ ඒක මගේ යෝජනාවක් කියලා. ඒ නිසා සභාපතිතුමා මින් ඉදිරියට ගමේ දෙයක් කරනවා නම් ඒ කොට්ඨාශයේ අනෙක් මන්ත්‍රීවරුන්වත් දැනුවත් කරන්න. ඒ වගේම ඔබතුමා හරියට නියාමනයක් කරන්න සභාවේ යන්ත්‍ර අරගෙන ගිහින් මොනවද කරන්නේ කියලා.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>
සුනේත්‍රා මන්ත්‍රීතුමිය යෝජනාවක් දාන්න ඇති නමුත් ඒ වැඩේ වෙලා නැති නිසා අන්තිම වෙනකන් බලලා තමයි මේ වැඩේ කලේ. එතකොට අවම සදාචාරයක් තියෙනවාමේක මම කලින් දාපු යෝජනාවක් මේක ජනතා විමුක්ති පෙරමුනේ මන්ත්‍රීතුමාත් කතා කරලා තමයි මේ කරන්නේ කියලා කියන්න.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
වසර ගණනනාවක් තිසසේ මන්ත්‍රීවරු ඉල්ලීම් කරන පාරක් තමයි ඔය ශානිත් මාවත පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපාතිය. ප්‍රදේශවාසීනුත් සුනේත්‍රා මන්ත්‍රීතුමියත් මගෙන් ඉල්ලීම් කරලා තිබුනා මේ පාර සංවර්ධනය කරලා දෙන්න කියලා. නමුත් අපිට ඒක කරන්න බැරි වුනා. මේ සිදුවීමට සති දෙකකට විතර කලින් මම තාක්ෂණ

නිලධාරීන්ව යවලා මේ මාර්ගය සම්බන්ධයෙන් වාර්තාවක් ලබා ගත්තා. ඒ අනුව මේ ව්‍යාපෘතිය කරන්න ඉස්සෙල්ලා තමයි සමිත් මන්ත්‍රීතුමා මගෙන් ඉල්ලීමක් කළේ අත්‍යවශ්‍ය කාර්යක් තියෙනවා මෝටර්ග්‍රේඩරය ලබා දෙන්න පුළුවන්ද කියලා. ඒ අනුව මම ලබා දුන්නා. නමුත් ඒ අවස්ථාවේ කිව්වේ නෑ මොකක්ද කොතනද කරන්නේ කියලා. වැඩේ කරන දවසේ කිව්වා පැය දෙකක විතර වැඩක් ඒක ඉක්මනට ඉවර කරලා එවන්නම් කියලා. මමත් දැනගෙන හිටියේ නෑ මේ මම තාක්ෂණ නිලධාරීතුමිය ඇරලා වාර්තාවක් ලබා ගත්ත පාරේ මේ ව්‍යාපාතිය කරන්නේ කියලා. හවස මේ සිදුවීම ආරංචි වුනාම තමයි මම දන්නේ මම වාර්තාවක් ලබා ගත්ත සුනේත්‍රා මන්ත්‍රීතුමියත් ඉල්ලීම් කරපු පාරේ තමයි මේ ව්‍යාපෘතිය සිදු වුනේ කියලා.
කවුරුත් බලාපොරොත්තු වෙන්නේ ප්‍රදේශයේ ජනතාවට වැඩක් කරන්න. එතනදී සාමදානව සාකච්ඡා කරලා බුද්ධිමත්ව ඒ කටයුත්ත කරගත්තොත් හොඳයි. නැත්නම් එකෙන් අපහසුතාවයට පත් වෙන්නේ මමයි. විශේෂයෙන්ම කියන්න ඕනා ඔබතුමන්ලා චෝදනා කරනවා අවුරුදු 4කින් ලයිට් දුන්නේ නෑ පාරක් හැදුවේ නෑ කියලා. මේතනදී හැම දෙනාම එකමුතු වෙලා වැඩ කරනවා නම් ඒකෙ පහසුව මට තියෙනවා. ගමේම මිනිස්සු හිනා වෙනවා වැඩක් කරන කොට රංඩුවෙවී කරනවා නම්. ඉදිරියේදී මෙවැනි කටයුතු නොවන ආකාරයට වගබලා ගන්න කියලා සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා. තියෙන කෙටි කාලය තුළ මුදල් ප්‍රතිපාදන තියෙන විදිහට ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ඨ සිද්ධ කරන්න බලාපොරොත්තු වෙනවා. මේ ප්‍රාදේශීය සභා කාලය අවසනාවන්තම කාලය. එහෙම කියන්නේ මේ සභා කාලයේදී අපිට කිසි දෙයක් හරියට කර ගන්න බැරි වුනා. සහරාන්ගේ ප්‍රහාර ආවා කොරෝනා වසංගතය ආවා රටේ ආර්ථික අර්බුදය ආවා. මීට කලින් සභාවලට ඕන තරම් මුදල් ප්‍රතිපාදන ලැබුනා. අපිට ලැබෙන්න තියෙන මුදල් ඉක්මනින්ම ලබා ගෙන මන්ත්‍රීවරුන්ට අවශ්‍ය ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කඩිනමින් කරන්න බලාපොරොත්තු වෙනවා.සභාපතිවරුන් කරන ලද ඉල්ලීම්වලට අනුව මේ වන විට චක්‍රලේඛ ලිහිල් කරලා තියෙනවා ප්‍රදේශයේ ජනතාවගේ සංවර්ධන කටයුතු කරන්න ඕන නිසා. ඒ පිළිබඳව ජනාධිපතිතුමාටත් අගමැතිතුමාටත් රාජ්‍ය ඇමතිතුමාටත් ස්තූතිවන්ත වෙනවා. ඒ අනුව සභාවේ මුදල් තියෙන විදිහට සභාවට එන්න තියෙන මුදල් ප්‍රතිපාදන කඩිනමින් ලබාගෙන මේ සංවර්ධන වැඩ කටයුතු ආරම්භ කරනවා. එහිදී ඔබතුමන්ලා සහයෝගයෙන් කටයුතු කරන්න. ප්‍රමුඛතාවය අනුව ප්‍රදේශවල සංවර්ධන කටයුතු කරමු කියන යෝජනාව කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ප්‍රියන්ත අල්විස් මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

මීට වසරකට කලින් ඔබතුමාත් යෝජනා කරලා මුදල් කමිටුවේදීත් සාකච්ඡා කරලා විදුලි කනුවල අංකයක් ගහන්න යෝජනා වුනා. ඒකෙ තත්ත්වය මොකක්ද කියලා දැනගන්න කැමතියි.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

ඒක ක්‍රියාත්මක වෙමින් තියෙනවා. හැම සතියකම බ්‍රහස්පතින්දා විදුලි කණු අංක කරණය කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ප්‍රියන්ත අල්විස් මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

විදුලි පහන් සවි කිරීමේදී නව තාක්ෂණයක් තියෙන විදුලි පහන් සවිකරගෙන යනවා. කුරුස හන්දියේ මහබෙල්ලන හයි කරලා තියෙනවා. අරුග්ගොඩ පැත්තට යන කොට හන්දි ටිකක් තියෙනවා. ඒ ප්‍රදේශවලත් වැඩි ජනතාවක් ඉන්න නිසා ඒ හන්දි ටිකටත් විදුලි පහන් සවි කරනවා නම් හොඳයි.
මීට වසර දෙකකට විතර කලිනුත් මම මේ යෝජනාව කළා. අරුග්ගොඩ සොහොන් පිට්ටනියට කණු ගෙනත් දානවා සුසානභූමියේ භූමිදානයකට වලක් කපන්න ගියාම විශාල වියදමක් දරන්න ඕනා ඒක සුද්ද කරගන්න. ඒක නිසා සුසානභූමියට කසල දැමීම තහනම් කියලා බෝඩ් එකක්හරි දාන්න අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. කසල එකතු කිරීමේදී අරුග්ගොඩ පුළුන්ගහ පාරේ කසල එකතු කරන්න පුළුවන් කියලා මට දැනුම් දුන්නා. නමුත් ඊට වඩා වැඩි ජනගහනයක් ඉන්න ලෙස්ලි ගුණවර්ධන මාවතේ කසල එකතු කිරීම කරනවා නම් හොඳයි. නැත්නම් මගෙන් ප්‍රශ්න කරයි පුළුන්ගහ පාරේ කසල ගෙනියන්න පුළුවන්නම් ඇයි ලෙස්ලි ගුණවර්ධන මාවතේ එන්නේ නැත්තේ කියලා. ඒ නිසා ඒ පාරෙත් එවන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

ඉල්ලීම් ලිපියක් ආවා ඒ අනුව තමයි සෞඛ්‍ය පරිපාලක මහතා ඔබතුමාගෙන් විමසා හිටියේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ප්‍රියන්ත අල්විස් මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

මගේ කොට්ඨාශයේ කාගේ හරි ඉල්ලීමකට එහෙම දෙයක් වෙනවා නම් හොඳයි. ඒ වගේම අනිත් පාරවල්වල අය ගැනත් හිතලා ඒ පාරවල් වලත් එවනවා නම් හොඳයි. ඒ ගැනත් සළකා බලලා ඉෂ්ඨ කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වගේම පුළුන්ගහගාව තියෙන වෙන්දේසි කරන ඉඩමේ වතුර බැස්ම විධිමත් නෑ. ඒකට අනුමැතියක් දෙනවා නම් නිවැරදිව හැදුවට පස්සේ අනුමැතිය ලබා දෙන්න.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

ඒක මම ගියා බලන්න. ප්‍රදේශවාසීන් එක්කත් මම කතා කළා. අදාළ ආයතනත් කැදෙව්වා. කානු පද්ධතිය එන්න ඕන විදිහ සම්බන්ධව ඒ අයට උපදෙස් දීලා තියෙනවා. තවම අනුමැතියක් දීලා නෑ. දීලා තියෙන උපදෙස් ඉටු කළාට පස්සේ තමයි අනුමැතිය දෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ප්‍රියන්ත අල්විස් මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

හිරණ පාර සම්බන්ධව හැමදාම මම කතා කළා. ඒ පාර සකස් කරන්න වැඩපිළිවලක් මම සකස් කර ගත්තා. සභාවේ යන්ත්‍ර ලබාගෙන ඒ කටයුත්තෙන් බාගයක් විතර ඉටු කළා. තව විශාල ප්‍රමාණයක් තියෙනවා සකස් කර ගන්න. යන්න බැරිම තැන් ටික යන්න පුළුවන් තත්ත්වයට හදලා දුන්නා. වක්‍රලේඛ නිසා අලුත් ව්‍යාපෘති කරන්න බැරි එකේ තියෙන කාපට් පාරවල් ටික ආරක්ෂා කර ගන්න දෙපැත්තේ ගැට්ටවල් වලට ප්‍රිමික්ස් ටිකක් දාලා ආරක්ෂා කර ගමු. ඒ වගේම පාරවල් වල දෙපැත්තේ තණකොළ කපන එක ක්‍රියාත්මක වෙන්නේ නෑ. ඒ සේවකයින් නැති ප්‍රශ්නය නිසාද?

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

කොට්ඨාශවල සංවර්ධන කටයුතු සම්බන්ධව මන්ත්‍රීතුමන්ලා දිගින් දිගටම කතා කරනවා. අපි ගාව ඉන්න සේවකයින්ගෙන් එදාට පැමිණ සිටින සේවකයින් උපරිම සේවයක් කරනවා. එදා හිරණ පාර සකස් කරන දවසේ ප්‍රිමික්ස් අනන දවස. එදා දෙන්නයි ප්‍රිමික්ස් අනන්න හිටියේ.  බන්ඩාරගම වැඩ අංගනයෙන් තුන්දෙනෙක් එව්වා ප්‍රිමික්ස් අනන්න. එදා හිරණ පාර හදන්න සේවකයින් එවන්න විදිහක් නෑ. ඒ නිසයි මම කිව්වේ වාහන ටික විතරයි ලබා දෙන්න පුළුවන් සේවකයින් ලබා දෙන්න විදිහක් නෑ කියලා. දිනවලට පාරවල් වෙන් කරලා තියෙනවා ප්‍රිමික්ස් දාන්න. එක දවසක් හරි ප්‍රිමික්ස් ටික අනාගන්න බැරි වුනොත් ප්‍රිමික්ස් දාන එක දවසකට දෙකකට අදාළ වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ප්‍රියන්ත අල්විස් මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

වාහන යන්ත්‍ර ටික ලැබුණත් අපි කාවහරි යොදවන්න ඕනා.අපිට කාවවත් නිකන් යොදවන්න බෑ. පාරක් හදන්න යන්ත්‍ර සූත්‍ර ටික ලැබුනත් රු.3000-4000ක් විතර එක් මන්ත්‍රීවරයෙක් වියදම් කරන්න වෙනවා. පාරක් හදන්න ආවහම ඒ එන කන්ඩායමට කෑම ටික තේ ටික අපි සූදානම් කරන්න ඕනා. ඒ සඳහා ගැටළු අපිට තියෙනවා. මේ ගැන ටිකක් සළකා බලන්න කියලා ඉල්ලනවා. අනිත් කාරණය වැසිකිළි නැති අයට වැසිකිළි ආධාර දෙන වැඩසටහන අනුව 4-5 දෙනෙකුට ආධාර ලබා දීලා තියෙනවා. හැබැයි තවත් ඉන්නවා වැසිකිළි හදාගන්න අපහසුතාවයෙන් ඉන්න ඒ බඩු ටික බලාපොරොත්තුවෙන් ඉන්න මිනිස්සු. ඒ පිළිබඳවත් නැවත වතාවක් බලන්න.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

ඉතුරු ටිකත් අපි ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. අපිට වැසිකිළි ආධාර ලබා දෙනවා කියලා ලබා දෙන්න පුළුවන් අඩු ආදායම්ලාභී පවුල්වලට විතරයි. ඒ නිසා වැසිකිළියක් අවශ්‍යයි කියන පවුල් වලට විතරක් වැසිකිළියක් ලබා දෙන්න යෝජනා කරන්න කියන ඉල්ලීම කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමින්ද දිසානායක මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ

ගරු සභාපතිතුමනි, මම නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේදීත් මේ සම්බන්ධව කතා කළා. කිදෙල්පිටිය අරලිය ඉඩමේ පොදු ඉඩම් කොටස වෙන් කිරීම සම්බන්ධව සාකච්ඡාවක් සංවිධානය කරනවා කිව්වා.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

ප්‍රදේශයේ මන්ත්‍රීතුමිය ඇතුළු ප්‍රදේශයේ ක්‍රියාකාරින් මගෙන් ඉල්ලීම් කරන්නේ සුසානභූමියෙන් කොටසක් අරගෙන මේ ක්‍රීඩාපිටිය පුළුල් කරන කටයුත්ත කරන්න කියලා. ඔබතුමා සුසානභූමිය ගන්නවට විරුද්ධයි. මම හදන්නේ සුසානභූමියෙන් කොටසක් හා මේ පොදු භූමිය යා කරලා පුළුල් කරලා ගමටත් ප්‍රයෝජනවත් වන ආකාරයට කටයුතු කරන්න. අනිත් කාරණය ලැන්ඩ් සේල් එකක් කරන කොට ඒකෙ පොදු කොටස වෙන් කරන්නේ කොහොමද කියලා ගමේ අයත් එක්ක සාකච්ඡා කරන්න අවශ්‍ය නෑ. මම තවමත් ඉන්නේ සුසානභූමියෙන් කොටසක් අරගෙන ක්‍රීඩාපිටියක් හදන්න ඕනා කියන තීරණයේ. ගමේ වැඩි පිරිසක් ඉන්නෙත් ඒ කාරණයේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමින්ද දිසානායක මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ

ඔබතුමා සාකච්ඡාවක් පවත්වනවා කිව්වත් මාස 6ක් ගියා තවමත් පැවැත්වුනේ නෑ. කොහොම හරි කනත්ත හරි බේරුනා. පසුගිය අටවෙනිදා අරලිය ඉඩමේ ඉඩම් විකිණීම ආරම්භ වුනා. මම ඒ අයගෙන් ඇහුවා කොහොමද අනුමැතිය නැතුව ඉඩම් විකිණීම ආරම්භ කරන්නේ කියලා. ඒ අය කියන්නේ අත්තිකාරම් ලබා ගන්න අනුමැතිය අවශ්‍ය නෑ කියලා. පසුගිය කාලයේ සභාපතිවරු කරපු වැරදි අපි තවම කතා කරනවා. මේකෙ පොදු භූමිය දැන් එල්

හැඩියට වෙන් වෙන්නේ. ඒක ඔබතුමාගේ කැමැත්ත. කවදාහරි ඊළඟ සභා කාලයකදී මේකෙ කිහිපදෙනෙක් හරි ඉදියිනේ එතුමන්ලා හරි දන්නවා එතකොට අපි මේ සම්බන්ධව කොච්චර කතා කළාද කියලා. ඔබතුමා මේ දේ කරලා කවදා හරි සුසානභූමියෙන් කොටසක් ලබා ගත්තහම පසුකාලෙක ඒක අභියෝගයකට ලක් වෙන්න පුළුවන්. ඔබතුමන්ගේ අභිමතය පරිදි මේ පොදු භූමිය වෙන් කළා ඒ තීන්දුව මේ සභාවට කියන්න. ඊළඟ සභාවේදී කාට හරි මේක අභියෝගයකට ලක් කරන්න පුළුවන්. ඔබතුමා මේ සම්බන්ධව නිශ්චිත උත්තරයක් දෙන්න.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
ඔය ප්‍රශ්නය දිගින් දිගටම ඔබතුමා කතා කරනවා. වසර ගණනාවක් තිස්සේම කිදෙල්පිටිය ග්‍රාම සේවා වසම් 3ටම ක්‍රීඩා පිටියක් නෑ. ඒ සඳහා සුදුසු භූමියක් කොහෙවත් තිබුනේ නෑ. ආපු හොඳම අවස්ථාව තමයි මේ අරලිය ඉඩමේ පොදු කොටස ලබා ගැනීම. මේ ඉඩම සභාවට පවර ගන්න කියලා කීප අවස්ථාවකදීම යෝජනාවක් ආවා. ඒක ප්‍රයෝගිකව කරන්න ලේසි පහසු කාර්යක් නෙමෙයි. කිදෙල්පිටියට ක්‍රීඩාපිටියක් ලබා දිය යුතුයි කියන මතේ මම හිටියා. සුසානභූමියේ නුග ගසින් පහළ කොටස ක්‍රීඩා පිටියක් විදිහට හදලා දෙන්න කියලා ජනතාව මගෙන් කීප අවස්ථාවකදීම ඉල්ලීම් කළා. ඒ අතර තමයි අරලිය ඉඩම වෙන්දේසි කිරීමේ යෝජනාව ආවේ. ඒක මා ගාවට ආව ගමන්ම මේ ඉඩමේ කට්ටි කඩන ආකාරයේ සැළැස්මක් ලබා ගෙන සුසාභූමියෙන් පිටිපස්සේ කොටස යා වෙන පරිදි පොදු පහුසුකම් කොටස වෙන්කරන්න කියලා කිව්වා. එතකේට ඒ කොටස් දෙක එකතු කරලා ක්‍රීඩා පිටියක් සකස් කර ගැනීමේ හැකියාව තියෙනවා. ඒ සඳහා ගමේ අය එකතු වෙලා රැස්වීමක් සංවිධානය කරලා මාවත් ඒ සඳහා කැඳෙව්වා. එහිදී සාකච්ඡා කරලා ප්‍රදේශවාසීන්ගේත් එකඟතාවය මේ සඳහා ආවා. එහිදී ප්‍රාදේශීය ලේකම්තුමියත් ඇවිත් පරීක්ෂා කරලා සුසානභූමියෙන් කොටසක් අවශ්‍ය නම් ප්‍රදේශයේ බහුතර ජනතාවගේ කැමැත්ත තියෙනවා නම් එය ලිඛිතව ඉදිරිපත් කරන්න කියලා ප්‍රකාශ කලා. එදා මේ ක්‍රීඩාපිටිය සඳහා කැමැත්ත තිබිලා ඒ සඳහා සුසාන භූමියෙන් කොටසක් ලබාගත යුතුයි කියන අදහසේ හිටපු ඔබතුමා මොනයම් හේතුවක් නිසා හරි ඊට පස්සේ විරුද්ධ වෙනවා. මම ගමේ අයගේ කැමැත්ත ලබා ගන්න අත්සන් ලේඛනයක් ගමේ ක්‍රියාකාරීන් අතේ යැව්වා. එහිදී කීපදෙනෙක්ම කියලා තියෙනවා චමින්ද මන්ත්‍රීතුමා කිව්වා මේක සුසානභූමිය විනාශ කරන වැඩක් කරන්න යන්නේ මේකට කැමැත්ත දෙන්න එපා කියලා. මුලදී ඔබතුමා මේ සඳහා කැමැත්තෙන් ඉඳලා බලන්න ගිහින් සාකච්ඡාත් කරලා අවසානයේ තමයි අකමැති වෙන්නේ. ඔබතුමා ඉතිහාසයේ සභාපතිවරු කරපු වැරදි සම්බන්ධවත් ප්‍රකාශ කළා. මගේ කාලය තුළ ඉඩමක් වෙන්දේසි වුනා නම් මම කවදාවත් බෑවුමක් කළුගලක් මිනිස්සුන්ට ලගාවෙන්න අමාරු තැනක පොදු ඉඩම් කොටස ලබා ගත්තේ නෑ. සභාවට ගත යුතු සුදුසුම තැන පොදු පහසුකම් කොටසට වෙන් කරගෙන තියෙනවා. මේකෙ පොදු පහසුකම් කොටස තුළින් මම බලාපොරොත්තු වෙන්නේ ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම අනුව වෙන්දේසි ඉඩමේ පදිංචිකරුවන්ටත් ගමේ පදිංචිකරුවන්ටත් ඒකාබද්ද කරගෙන මේක ක්‍රීඩාපිටියක් හැටියට පවත්වා ගන්න. මේක දෙපාර්ශවයටම ක්‍රීඩාපිටියක් ලබා ගැනීමේ චේතනාවෙන් හා සද්භාවයෙන් තමයි මම මේ පොදු පහසුකම් කොටස වෙන් කරන්නේ. ප්‍රදේශවාසීන් බහුතරයක් මට කියනවා නම් ක්‍රීඩාපිටියක් අවශය නෑ කියලා මටත් අවශ්‍ය නෑ. ඔබතුමා කරපු බාධා කිරීම් එක්ක මිසක් මේ ක්‍රීඩාපිටිය ලබා දිය යුතුයි කියන මතේ ඉඳලා මාත් එක්ක කටයුතු කළා නම් අද වන විට සුසානභූමියට උඩින් තාප්පය බැදලත් ඉවරයි සුසානභූමියේ කොටස ඩෝසර් කරල කොටස් දෙක යා කරලා ක්‍රීඩාපිටියක් හදලා ඉවරයි. ඔබතුමාගේ බාධා කිරීම් එක්ක තමයි මේක නතර වෙලා තියෙන්නේ.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී චමින්ද දිසානායක මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>
පොදු පහසුකම් කොටසින් ලැබෙන්නේ පර්චස් 154යි. මේකෙන් ලොකු ක්‍රීඩාපිටියක් හද්නන විදිහක් නෑ. මේ වෙනුවෙන් කනත්තෙන් බාගයක් දෙන්න වෙනවා. කනත්ත අක්කර දෙකයි තියෙන්නේ. ගමේ පවුල් 2500කට වැඩිය ඉන්නවා. ගමේ මිනිස්සු කැමති නෑ මේකට. මේකෙන් ගමේ මිනිස්සුන්ට අසාධාරණයක් වෙනවා. ඒකයි ඔබතුමාට සාකච්ඡාවක් කැඳවන්න කිව්වේ. ඔබතුමා හිතන්නේ මම විතරයි මේකට විරුද්ධ කියලා. ඔබතුමා සාකච්ඡාවක් කැඳවන්නේ නැත්තේ ඇයි කියලා මම දන්නේ නෑ. කොහොම හරි මම නිසා කනත්ත බේරුනා. රජයේ ඉඩමක් ගොඩකරලා හරි ක්‍රීඩාපිටියක් හදන්න පුළුවන්. නමුත් කනත්තක් හදාගන්න එක ලේසි නෑ. නාගරික සංවර්ධන අධිකාරියෙන් ඇවිල්ලා මේ වෙන්දේසි ඉඩම බලලා කියලා තියෙනවා මේක ප්‍රයෝජනවත් විදිහට බෙදලා නෑ කියලා. ඒ ඉඩමට එන පවුල්වලට හරි නිසිආකාරයෙන් ප්‍රයොජනයක් ගන්න පුළුවන් විදිහට පොදු භූමිය වෙන් කරන්න් කියලා කියනවා. මේ වෙන්දේසි ඉඩම සඳහා අනුමැතිය ලබා දීලා තියෙනවද?

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
අනුමැතිය තාම දීලා නෑ.තවම කානු පද්ධතියේ ප්‍රශ්න තියෙනවා. ඒ ගැටළු නිරාකරණය කරගෙන අවසන් වුනාට පස්සේ තමයි අනුමැතිය දෙන්නේ.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ</u>

ගරු සභාපතිතුමනි, 664 වීදාගම බටහිර පිං ළිඳ ගැන මම අහන්නේ. ඒකෙ ඇස්තමේන්තුවක් හදන්න කියලා කිව්වා. නමුත් නිලධාරියා මම මතක් කළාම තමයි එතනට ගිහින් බැලුවේ. ඊට පස්සේ කියනවා ඒක බලන්න විදිහක් නෑ එතන කලෑව වැවිලා කියලා.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

මම උපදෙස් දුන්නා සේවකයින් දම්මලා මුලින්ම සුද්ද කරන්න කියලා. අස්තමේන්තුවක් හදන්න විදිහක් නෑ ඒකෙ වට ප්‍රමාණයවත් බලන්න විදිහක් නෑ කැලෑව වැවිලා තියෙන්නේ. එතන සුද්ද කරලා ඉවර වෙලා ඇස්තමේන්තුවක් හදමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ</u>

ඒ වගේම වැසිකිළි හදලා දීමේ කටයුත්ත මීට අවුරුදු 2 ½ කට විතර කලින් කරපු යෝජනාවක්. ඒක යම්තාක් දුරකට සාර්ථක වෙලා ආවා. නමුත් කුමන හේතුවක් නිසා හරි තවම ඒ ටික හරියට දී ගන්න බැරි වුනා. මේවායින් ඔබතුමාත් අපිත් අපහසුතාවයට පත් වෙනවා. මේවා ඉක්මනට ලබා දෙන්න ඔබතුමා මැදිහත් වෙලා කටයුතු කරන්න. ඒ වගේම මේ සභාවට ආව දවසේ ඉඳලා කසල කළමණාකරණට ඔබතුමා සෑහෙන්න වෙහෙසක් දැරුවා. ඉඩමක් නමුත් ඉඩමක් ගන්න ගියාම ඒකටත් විපක්ෂය විරුද්ධ වුනා ඉඩමක් හොයාගෙන තිබුනත් ඒ බාධා කිරීම් හමුවේ ඒක යට ගියා. සභාව මගින් එකතු කරනු ලබන්නේ මධ්‍යම පාන්තික මිනිස්සුන්ගේ කසල. දුප්පත් අසරණ මිනිස්සු කසල දෙන්නේ නෑ.ඒ අයට අවශ්‍ය කාරණාවන් ප්‍රාදේශීය සභාව මගින් ඉටු වෙන්නෙත් නෑ. නමුත් අපි කසල එකතු කරනවා මධ්‍යම පාන්තික මිනිස්සුන්ගෙන් හා මහා පරිමාන ව්‍යාපාරිකයින්ගෙන්. දුප්පත් මිනිස්සුන්ගෙන් බදු එකතු කරලා ඇති හැකි අයගේ කසල එකතු කරලා යවන්න ඒ මුදල් වියදම් කරනවා. මන්ත්‍රීවරු ගොඩක් දෙනෙක්ට මේ මුදල් අපතේ යාම ගැන ලොකු කණගාටුවක් තිබුනා. අපිත් විවිධ උත්සාහ ගත්තා කසළ කළමණාකරණය කර ගන්න. මේ සභාව කෝටි 4කට වැඩි මුදල් කසල කළමණාකරණය වෙනුවෙන් වැය කරලා තියෙනවා. මම සද්භාවයෙන් සභාවේ මන්ත්‍රීවරයකුට කතා කරලා එතුමාගේ වත්තට කසල ගෙනත් දාන්න අවස්ථාව ලබා දුන්නා. එතුමාත් කොම්පොස්ට් හදන්න බලාපොරොත්තුවෙන් තමයි කසල ලබා ගත්තේ. නමුත් පුවක් ලෙලි වගේ වැඩකට නැති කසල තමයි ගිහින් දාලා තිබුනේ. පසුවිපරමක් නොකිරීම තුළ ගඳ ගැසීමක් හා මැස්සන් බෝ වීමක් සිදු වුනා. නිලධාරීන්ගේ පසුවිපරමක් නොකිරීම තුළ ඒ අවට ජනතාව පීඩාවට පත් වුනා. ඒකෙන් ඒ මන්ත්‍රීවරයාත් අසරණභාවයට පත් වුනා. නමුත් එතුමා අපි ගැන හිතලා නිවැරදි ආකාරයට කානු ටික කපලා කසල ටික දාලා වහලා දාන්න කියලා නැවතත් අවස්ථාව ලබා දුන්නා. ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ගේ ක්‍රියා කලාපය නිසයි එතන ගැටළුවක් ඇති වුනේ. මේ නිලධාරීන්ගේ ක්‍රියා කලාපය ගැන හොයා බලන්නම ඕනා.

ඒ වගේම රොටරිගම ප්‍රජා ශාලාවේ අවුරුදු 3-4ක ඉඳලා වතුර ගැටළුව තියෙනවා. ඒකෙ බට කපලා දාලා තියෙනවා. ඒක ජනතාවට ලබා දෙන්න කියලා කීප සැරයක්ම ජනතාවගෙන් ඉල්ලීම් තිබුනා. නමුත් මෛත්‍රී පෙර පාසල එතනට ගේනවයි කියලා තිබුන නිසා ඒක පසුබෑමකට ලක් වුනා. ඒ ප්‍රජා ශාලාවට වතුර ගන්න අවස්ථාව සළසලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඔබතුමා දෙල්ගස්වත්ත පන්සල පාර ප්‍රිමික්ස් දාලා තිබුනා. ඒකට ස්තුතිවන්ත වෙනවා. වැව පාර අබලන් තත්තවයේ තියෙන්නේ ඒ වලවල් වලට මිනිස්සු පස් දාලා තමයි වලවල් වහගෙන තියෙන්නේ. ඒ පාර සකස් කිරීම තවම සිදු වුනේ නෑ. ඒකත් අවශ්‍යම පාරක් ඒකත් සකස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම සෝමානන්ද පාරට අපි මේ වෙලාවේ ප්‍රම්බත්වයක් දිය යුතුයි. ඒ පාර සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරි ගිහින් ඇස්තමේන්තුවක් හදලා තියෙනවා. ඒ කටයුත්තත් ඉක්මනින් කරලා දෙන්න. ඒ වගේම වැව්ට වැවේ පස් ටික නිකන් හරි දීලා ඒ වැඩේ ඉක්මනට කළා නම් හොඳයි මේකෙ මම දකින්නේ වැව් බැම්ම තමයි පළල් කරන්නේ.ඒ තුළ වැව පුංචි වෙන ප්‍රවනතාවයක් තියෙනවා. පස් ටික බැම්මට දාලා තුනී කරලා දානවා. පිහිටි වැවයි තියෙන්න ඕනා.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

ඒකෙ මන්ත්‍රීතුමා කළුගල් අල්ලන්න හදන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඩී.චම්පා ජයංගනී කන්නන්ගර මැතිණිය - එක්සත් ජාතික පක්ෂය</u>

ගරු සභාපතිතුමනි, කොළමැදිරිය කයීන පිංකම අලෝතියාව හන්දියේ ඉඳලා තමයි තියෙන්නේ. පාරේ එක ලයිට් එකක්වත් වැඩ කරන්නේ නෑ. නකානෝ එකට හැරෙන තැන ඉඳලා පන්සල ගාවට වෙනකන් හරි ලයිට් ටික හදලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගුරුගේ මාධව දිලංක මැතිතුමා - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය</u>

ගරු සභාපතිතුමනි, පසුගිය සභාවේදීත් මම කිව්වා මම එන අන්තිම සභාව මේක වෙන්න පුළුවන් කියලා. මම ඉල්ලා අස්වීමේ ලිපිය දීලා තියෙන්නේ. පක්ෂ ව්‍යවස්ථාවට අනුව මාව අයින් කරන්න බෑ. මම උසාවි ගියා නම් නඩුව ගන්නේ මාස 6කින්. එතකොට මාව අයින් කරන්න කොහෙත්ම බෑ මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලුම

තනතුරුවලින් අයින් වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඡන්දය දීපු අය නිසානේ මම මෙතනට ආවේ. මම බලාපොරොත්තු වෙනවා වෙනත් පක්ෂයකින් දේශපාලනය කරන්න. එතනට යන කොට මම මගේ මන්ත්‍රීධුරයත් සියලුම තනතුරුත් අතහැරලා යන්න ඕනා. සමහර අය ඉන්නවා මෙතන පක්ෂය කියන්න බයයි මන්ත්‍රීපුටුව නැති වෙයි කියලා. සමගි ජන බලවේගයේ අලුත් සංවිධායකතුමා මට ආරාධනා කළා දේශපාලනය කරන්න එන්න කියලා. බොහෝ දුරට මම සමගි ජනබලවේගයෙන් දේශපාලනය කරන්න ඉඩ තියෙනවා. මගේ දේශපාලනය කියන්නේ මම ඉන්න  තැන කොතනද කියන එක. මම නිදහස් ප්කෂය දාලා යනකම්ම මම නිදහස් ප්කෂය සමඟ ඉන්නවා. ඒකෙ සංවිධායකතුමාට ඕන අය දා ගන්න ඕන නිසා මම ඉල්ලා අස්වීම භාර දුන්නා. මම මේ තනතුර භාර ගන්න කොටම කිව්වා මම මාස 6යි ඉන්නේ තව කෙනෙකුට මේක දෙනවා කියලා. මම කොට්ඨාශය දිනලා ආවා නම් මම යන්නේ නෑ. මම උපරිම උත්සාහයක් ගත්තා තල්පිටිබද්දට මන්ත්‍රීධුරයක් තියාගන්න නමුත් ඒක කරන්න විදිහක් නෑ පක්ෂයේ සංවිධායකට ඕන කෙනාට තමයි දෙන්නේ. ඒ පක්ෂයේ ඉදන් මන්ත්‍රීධුරය තියාගෙන රංඩු වෙවී ඉදලා වැඩක් නැති නිසා මම ඉල්ලා අස්වීම භාර දුන්නා. මම බණ්ඩාරගම දිගටම දේශපාලනය කරනවා. මේ සභාවේ මගේ මන්ත්‍රීධුරයට වඩා සභාපතිතුමාගේ හිතවත්කම මත තමයි ගොඩක් දේවල් සිදු කලේ. මේ මාස කීපයට සභාපතිතුමා මට උපරිමයෙන් උදව් කළා. උප සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරු මට උදව් කළා. මාව අයින් කරලා වෙනත් කෙනෙක් පත් කලා කියලා ගැසට් කළාට පස්සේ මම එදා ඉදලා පූර්ණ කාලීනව දේශපාලනය කරනවා මම තෝරාගන්න පක්ෂයත් එක්ක. මට පිං මන්ත්‍රීකමක් අරගෙන ඉන්න ඕන නැති නිසා මේක දීලා ඊළඟටඅලුතින් දේශපාලන පක්ෂයක් සමඟ මම පූර්ණකාලීනව දේශපාලනය කරනවා. මම මීට වඩා හොදට දේශපාලනය කරලා ගමට වැඩක් කරනවා.

<u>ගරු උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. පසුගිය සභා වාරයේ සිදු කරපු වැරැද්දක් නිවැරදි කිරීමක් කරන්න ඕනා. මහේෂ් කොතලාවල මන්ත්‍රීතුමා කිව්වා මේ සභාවේ අසුන් වෙන් කිරීම කරන්න ඕනා ජේෂ්ඨත්වය අනුව ඒ අනුව මට මේ ආසනයේ ඉන්න බෑ ඉන්න ඕන සමන්පා මන්ත්‍රීතුමා කියලා. ප්‍රාදේශීය සභා පනතේ තියෙනවා ආසන වෙන් කරන විදිහ. ඒකෙ තියෙනවා සභාපති, උප සභාපති ඊට පස්සේ ජේෂ්ඨත්වය අනුව කියලා. ඒ නිසා ඒක නිවැරදි කරනවා.

ගරු සභාපතිතුමනි. මට තේරුනා ඔබතුමා ඉන්නේ අමාරුවක අපිට වැරදුනා අපි බලාපොරොත්තු වෙච්ච දේවල් සංධානය ඇතුලේ කර ගන්න බැරි වුනා. ඒක සභාපතිතුමාගේවත් මගේවත් මේ මන්ත්‍රීවරුන්ගේත් වරදක් නෙවෙයි ආණ්ඩුවේ වරද මේ ආන්ඩුව ගමන් කලේ සෞභාගයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව නෙමෙයි. 20 වන ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක කෙනෙක් මේකට ඇවිල්ලා අද වන විට බංකොළොත් භාවයට රට පත් වුනා කියලා ප්‍රකාශ කරලා තමයි ආණ්ඩුව නැති වුනේ. ඒ අරගලය ආණ්ඩුව ඇතුළේ අපේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් කරන්න ගිහින් තමයි ආන්ඩුවෙන් එළියට යන්න වෙලා ගැටළුවක් බවට පත් වෙලා අද වන විට රනිල් වික්‍රමසිංහ ජනාධිපති වෙන එක දක්වා ඇවිත් තියෙන්නේ. ව්‍යවස්ථාවට අනුව එතුමාට ජනමතයක් නෑ. අපි මේ සභාවට ආවේ දහසක් බලාපොරොත්තු තියාගෙන. ඒවායින්  50%ක්වත් අපිට ඉෂ්ඨකර ගන්න බැරි වුනා. විපක්ෂයේ මන්ත්‍රීවරුගම්වල තියෙන අඩුපාඩු ගැන කතා කරන කොට මමත් කිව්ව දෙයක් තමයි අපිට ආන්ඩුව ලැබෙනකන් ඉන්න කියන එක. ආන්ඩු විටින් විට ඇති කරපු වැරදි සාජ ආර්ථික දේශපාලනික ප්‍රතිපත්ති නිසා අවු.2 ½ ක් ආණ්ඩුව කරන්න බැරි වුනා. ඒ දේ නිසා සභාවත් අපිත් අසරණ වුනා. අපි ජනතාවගෙන් සමාව ඉල්ලන්න ඕනා. මගේ කොට්ඨාශයේ ප්‍රධාන පාරවල් ටික අබලන් වෙලා තියෙනවා. ගමකට ප්‍රධාන අවශ්‍යතාවය පාර. ඒක ආණ්ඩුවට සල්ලි නෑ කියලා කල් දාන්න බෑ. ඒක නිසා චක්‍රලේඛ ලිහිල් කරලා අවශ්‍යතාවය අනුව අපිට කටයුතු කරන්න පුළුවන්. ඒකට සභාපතිතුමාට බලය තියෙනවා. ඔබතුමා හැම ගමකටම යන්න. ප්‍රමුඛත්වය තෝරලා ඒ අනුව කටයුතු කරන්න.  ගම්වල පාරවල් වල යන්න පුළුවන් විදිහට ප්‍රිමික්ස් ටික දාලා හරි හදලා දෙන්න ප්‍රමුඛත්වය දෙන්න. ඒ නිසා සභාපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඔබතුමාගේ අවධානය යොමු කරලා මගේ කොට්ඨාශයේ යන්නම බැරි පාරවල් ටික හදලා දෙන්න. අනෙක් කොට්ඨාශවලත් පාරවල් ටික හදලා දෙන්න. ඒවායේත් පාරවල් වල ප්‍රමුඛත්වය අනුව කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

මන්ත්‍රීතුමන්ලා කිව්ව පරිදි අවශ්‍යතාවය බලලා ප්‍රමුඛත්වය බලලා කටයුතු කරමු. අපිට මේ කාලය තුළ අපි බලාපොරොත්තු වුන පරිදි වැඩ කටයුතු කරගන්න බැරි වුනා. සහරාන්ගේ ප්‍රහාරය කොවිඩ් වසංගතය හා ආර්ථික ප්‍රශ්න එක්ක රජයෙන් මුදල් එවන්නේ නැති වුනා. ඒ හේතු කාරනා නිසා අපි අවාසනාවන්ත වුනා අපේ කාලය තුළ. නිරන්තරයෙන්ම මම සභාවේ ලේකම්තුමිය එක්ක කතා කරමින් තමයි සභාවේ මුදල් පාලන කටයුතු කරගෙන යන්නේ. අපේ මුද්දර ගාස්තු මුදල් එකතු කරලා සභාවේ මුදල් තියෙන ආකාරයට මේ වැඩ කටයුතු ටික කරනවා. මමත් හැම කොට්ඨාශයකම පාරවල් වල යනවා. මම නොදන්නවා නෙමෙයි මටත් ජනතාව කියනවා. මගේ කොට්ඨාශයේ පාරවල් ටිකට මම තවම ප්‍රිමික්ස් ටික දා ගත්තේ නෑ. මන්ත්‍රීතුමන්ලාගේ කොට්ඨාශවලට ඉල්ලන

ඉල්ලන වෙලාවට අපිට ප්‍රතිපාදන තිබුනා නම් කරන්න තිබුනා. නොතිබුන නිසා තමයි මේ තත්ත්වය උදා වුනේ කියන එක කියන්න ඕනා.

ගරු උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

යහපාලන කාලේ අපිට ප්‍රතිපාදන නොලැබුන නිසා කරන්න බැරි වුනා. කොරෝනා නිසා වැටිච්ච වෙන රටක් තියෙනවද ලෝකයේ. අපේ රට වගේ වෙනත් රටවල් වැටිලා නෑ. බංගලාදේශය ඉන්දියාව අපේ රටට ණය දෙනවා. අපේ රටේ අනුගමනය කරපු වැරදි දේශපාලන ආර්ථික වැඩ පිළිවෙල මත රට අර්බුදයකට ගියේ. ඔබතුමා පිළිගන්නේ නැති වුනාට මම නම් අසමත්. මට සෑහීමකට පත් වෙන්න පුළුවන් ආකාරයට මගේ කොට්ඨාශයේ මට වැඩ කරන්න බැරි වුනා. මේ අවුරුදු 4ම අපි ආණ්ඩුව රැක්කා. ඒ සාමූහික වගකීම මත. මම කියන්නේ ඔබතුමා මුද්දර ආදායම් කොහොම හරි ලබා ගෙන අපිට පාරේ බැහැලා යන්න පුළුවන් ආකාරයට පාරවල් ටිකට ප්‍රිමික්ස් ටික දාලා හදලා දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් කොතලාවල මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය

උප සභාපතිතුමා ප්‍රකාශ කළා පසුගිය සභාවේදී මම කිව්වා කියලා පළාත් පාලන පනතින් ජ්‍යේෂ්ඨත්වය පිළිබඳව සඳහන් වෙනවා මම ඒක ගැන නෙමෙයි සඳහන් කළේ. එදා උප සභාපතිතුමා මට කිව්වා මම පිනට මන්ත්‍රී ආසනයේ වාඩි වෙලා කියලා. මම එදා කිව්වේ සමන්පා මන්ත්‍රීතුමා, ගනේගොඩ මන්ත්‍රීතුමා වගේ පක්ෂයේ ජ්‍යේෂ්ඨයින් ඔබතුමා වෙනත් පක්ෂයකින් ඇවිල්ලා උප සභාපති පුටුවට ආව එක ඔබතුමාලාගේ පක්ෂයෙන් දීපු එකක් නිසයි මම කිව්වේ. පක්ෂයේ ජ්‍යේෂ්ඨයින් සිටිද්දී ඔබතුමා උප සභාපතිවුනේ පිනට කියන එක ගැනයි මම කිව්වේ.

ගරු උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

ඒක පක්ෂයේ එකඟතාවය මත සිදු වුනේ. පක්ෂ 11ක එකතුවක් සංධානය කියන්නේ. ඒකෙ පක්ෂවල ගිවිසුම් එකඟතාවයන් තියෙනවා. ඔබතුමා දන්නේ නැතුව කතා කරන්න එපා. මම උප සභාපති වුනේ ඒ එකඟතාවය මත.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් කොතලාවල මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය

ඔබතුමන්ලා කිව්වා රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති වුනේ පිනට කියලා. එතුමා ආවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව.
සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 7 දරන කඩ කාමරයේ තැන්පතු මුදල් වශයෙන් ගන්න ගාස්තුව එතුමාට ආයි ගෙවන්න කියලා ඉල්ලීමක් කරලා තියෙනවා. ඔබතුමා ඒ සම්බන්ධව ගත්ත ක්‍රියා මාර්ගය මොනවද කියලා දැනගන්න කැමතියි.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

ඒක ලබා දෙන්න පුළුවන් ගැටළුවක් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් කොතලාවල මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය

ඒ වගේම රයිගම ඩයස් මහතාගේ නිවස ඉදිරිපිට තියෙන කර්මාන්ත ශාලාවෙන් ඒ අයට අවහිරයි කියලා පැමිණිල්ලක් තියෙනවා.මෙතන ලොකු ප්‍රශ්නයක් තියෙනවා. මේකෙන් එන ශබ්දය හා දූවිල්ල ඒ අයගේ නිවසට ඇවිල්ලා ඒ අයට ඉන්න බෑ ලෙඩ රෝග හැදෙනවා. මේ සඳහා ඔබතුමා අවසර ලබා දීලාද තියෙන්නේ.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

ඒක අපිට අවසර ලබා දෙන්න පුළුවන් කර්මාන්ත ශාලාවක් නෙමෙයි. මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසර ලබා දෙන කර්මාන්තයක්. අපි ගොඩනැගිල්ලට නේවාසික හා ව්‍යාපාරයක් සඳහා අවසර ලබා දීලා තියෙනවා. කර්මාන්තය සඳහා පරිසර අධිකාරියෙන් තමයි අවසර ලබා දෙන්න ඕනා. ඒ සම්බන්ධව දෙපාර්ශවය කැඳවන්න කියලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.නෆ්ලි නසීර් මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. වීදි පහන් සවි කිරීම සම්බන්ධව ගැටළුවක් මතු වුනා. ඒකෙදී සිම්සාර් මන්ත්‍රීතුමා විදුලි පහන් පාසල ඉදිරිපිට සවි කළා. මගේ ඉල්ලීම පරිදි ඒ ප්‍රදේශයේ දානපතියන්ගේ හා සුභ සාධන කටයුතුවල නියැලෙන කීපදෙනෙකුගේ මැදිහත් වීමෙන් වීදි පහන් සවි කිරීමක් කළා.තව මගේ ඥතියෙක් මැදිහත් වෙලා තවත් ප්‍රදේශ කීපයක විදුලි පහන් 10ක් විතර සවි කරන්න කටයුතු කළා. සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා සේවකයින් යොදවලා ඒ කටයුත්ත කරලා දෙන්න කටයුතු කළාට. ඒ වගේම ඒ සේවකයින්ට මම යෝජනා කලා ගල්තුඩේ පන්සල ගාවත් එකක් සවි කරන්න කියලා. ඒක ළඟදීම හයි කරයි. වැව්ට වෙල් යායෙන් ඇතුල්වෙන

# බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

තැනටත් එකක් සවි කරන්න කියලා මම කිව්වා. මේ හේතුව නිසා අපිට අසල් වැසියන් සමඟ ගැටුම් ඇති කර ගන්න අවශය නෑ. සභාවෙන් වියදම් කරනවා කියන මතය ඇති වෙන්නේ නැති වෙන්න තමයි මම මේ ප්‍රකාශ කරන්නේ. මන්ත්‍රීවරු තුන්දෙනාම එකතු වෙලා තමයි ගමේ මේ වැඩ කටයුතු ටික කරන්නේ. අපි මොන පක්ෂය නියෝජනය කළත් අපි එකට එකතු වෙලා ගමට වැඩ කරනවා. අපි ක්‍රමවත් වැඩ පිළිවලකට අනුව මේ වැඩ කටයුතු සිදු කළ යුතුයි නැත්නම් ගැටළුකාරී තත්ත්වයක් පැන නගිනවා. සමහර තැන්වලට ලයිට් හයි කරන කොට ස්ථානීය පරීක්ෂාවක් කරලා එතනට සුදුසුද කියලා බලලා පිළිවලකට කරන්න කියලා ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් සෙනෙවිරත්න මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

සභාවේ මුදල් ප්‍රශ්න ගැන කතා වුනා. සභාවේ තියෙන මුදල් ටික වුනත් ප්‍රමුඛතාවය බලලා විනිවිදභාවයකින් යුතුව කළා නම් හොඳයි. මොකද අපේ කොට්ඨාශයේත් තියෙනවා ප්‍රමුඛතාවයන් ගොඩක්. කසළ ප්‍රශ්නය සම්බන්ධව මන්ත්‍රීවරු කතා කලා. මගේ කොට්ඨාශයේ ජනතාව කසල ප්‍රශ්නය සම්බන්ධව අපිට දොස් කියනවා. කිරිබේරිය පාර ගත්තහම කොස්ගස් හන්දියට එනකන් පානදුර නගර සභාවෙන් කුණු ටික එකතු කරනවා. ට්‍රැක්ටරය එතනින් ගිහින් මගේ කොට්ඨාශය පහු වෙනකන් ගිහින් දෙනිය වෙල් යාය ඉවර වෙන තැන ඉදලා ආයිත් කසල එකතු කරගෙන යනවා. එතකොට මිනිස්සු බනිනවා මේ ටිකේ විතරක් එකතු කරන්නේ නැත්තේ ඇයි කියලා.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

කසල ප්‍රශ්නය මාසයක් වගේ යන කොට විසදෙයි. මිල්ලනියත් සමඟ එකඟතාවයකට ඇවිත් තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රනීත් වැලිවිටගේ මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

සභාපතිතුමනි, මහජනතාවටත් පහසුවක් වගේම සභාවටත් හොද ආදායම් මාර්ගයක් වන යෝජනාවක් මම කරන්න කැමතියි.බන්ඩාරගම මහජන ක්‍රීඩාංගනයේ ක්‍රීඩා තරඟ පැවැත්වෙන කොට වාහන නතර කිරීමට තැනක් නැති නිසා අවට ජනතාවට ඒක ලොකු හිරිහැරයක්. මම යෝජනා කරන්න කැමතියි බණ්ඩාරගම පොළ භූමියේ ලොකු ඉඩක් තියෙනවා. ඒකේ රථ ගාලක් හැදුවා නම් සභාවට ලොකු ආදායමක් ලබා ගන්න පුළුවන්. ඒක මහජනතාවට පහසුවක් වගේම සභාවටත් හොද ආදායමක් ලබන යෝජනාවක් විදිහට මම දැක්කා. ඒක ක්‍රියාත්මක කරන්න මූලික වෙන්න කියලා ඉල්ලනවා. රොටරිගම ප්‍රජා ශාලාවට ජලය හා විදුලිය ලබා දෙන්න කියලා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේදීත් කතා කළා. ඒ අවම පහසුකම් දෙක විතරක් හරි ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම මීට පෙර කතා කල අටුළුගම පාරේ ලයිට් හයි කිරීම,ජනාධිපති මාවතේ ලයිට් හයි කිරීම,දෙල්ගස්වත්ත පන්සල පාර ප්‍රිමික්ස් කිරීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම වැව පාරත් බණ්ඩාරගම රාජා සමරනායක මාවතත් ඉක්මනින්ම සකස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.ගාමිණී සරත්චන්ද්‍ර මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය

මාධව මන්ත්‍රීතුමා සමගි ජනබලවේගයේ සංවිධායකතුමාගේ ආරාධනාවක් පරිදි පක්ෂයට එකතු වෙන්න අදහසක් තියෙනවා කියලා ප්‍රකාශ කළා. එන්න කියලා මමත් ආරාධනා කරනවා. නයනක කරුණාරත්න කියන්නේ ජේෂ්ඨ පරිසරවේදියෙක්. හොද මනුස්සයෙක් ප්‍රතිපත්තියක් ඇතුව කටයුතු කරන පුද්ගලයෙක්. ඒ වගේම තවත් අය එයි කියලා හිතනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී දීපානි කඳනආරච්චි මැතිණිය - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

ගරු සභාපතිතුමනි, රමුක්කන වෙලේ මෙහා පැත්තෙ කෙළවරේ ඉන්න ජයන්ත මහත්මාගේ නිවස අසල රාත්‍රී කාලයේදී කුණු ගෙනත් දානවා කියලා පැමිණිල්ලක් තියෙනවා. ළඟදී දිනයකදී ගෙනත් දාලා තිබුනලු විදුරු කපපුවාගේ කැලි තියෙන ලොකු පෝර බෑග් දෙකක්. එතුමා බණ්ඩාරගම සිංහ සමාජයේ සාමාජිකයෙක්. එතුමා ඉල්ලා සිටිනවා ඔබතුමාගේ අවසරයක් ගන්න කියලා ''කුණු දැමීමෙන් වැළකී සිටින්න'' කියලා සිංහ සමාජය හරහා බෝඩ් එකක් දාන්න. ඒ සඳහා ඔබතුමාගේ අවසරයක් ලබා දෙන්න පුළුවන්ද?

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
ඉල්ලීමක් ලිඛිතව කරන්න අවසරයක් ලබා දෙන්න පුළුවන්.

අද දින සභාව වෙත පැමිණිලා සභාවේ කටයුතු නිසි ආකාරයෙන් සිදු කිරීමට සහයෝගය ලබා දුන්න ගරු උප සභාපතිතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් බණ්ඩාරගම ජනතාවටත් මගේ ගෞරවනීය ස්තූතිය පුදකරමින් සියලු දෙනාටම සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා.

පස්වරු 01.40 ට සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා
සභාපති,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

එච්. ඒ. එච්. දේවේන්ද්‍ර පෙරේරා
සභාපති
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

*************************************************************